වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

ANNUAL REPORT

2015

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

இலங்கை போக்குவரத்துச் சபை

SRI LANKA TRANSPORT BOARD

අංක : 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05

இல.200, கிருல வீதி, நாராஹேன்பிட்ட, கொழும்பு 05

NO : 200, KIRULA ROAD, NARAHENPITA, COLOMBO 05

වාර්ෂික වාර්තාව

2015

ශ්‍රී ලංකාගමනාගමන මණ්ඩලය

පටුන

1.දැක්ම,මෙහෙවර ,අරමුණ

2.හැදින්වීම

3.සභාපතිතුමාගේ පණිවිඩය

4.කාර්යසාධනයසහප්‍රගතිසමාලෝචනය

5.අවසානගිණුම්

6.විගණකාධිපති වාර්තාව

දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක්, ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක ප්‍රමාණාත්මක සහ කාර්යක්‍ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. කොටුව මධ්‍යම බස් නැවතුම් පොළේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන් වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් පොකුරු බස් සමාගම්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත්සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ මාර්ගස්ථ ගබඩාවෙන් පවත්වාගෙන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්‍ෂක විමර්ශන, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

<u>හැඳින්වීම</u>

සියලුම ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක, නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනයකරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කළ බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවක් පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කළ බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටමවැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගීන් ප්‍රවාහනය කිරීම සඳහා පෞද්ගලික අංශයටද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කළ අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂමණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1993 වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කළ බැවින් අපේක්ෂා කළ ප්‍රතිඵල අත් නොවිය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තයන්, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, වෘත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂනයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්ණයට විසඳුමක් වශයෙන් "2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත" මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉදිරි ගමන පිළිබඳව තීරණාත්මක පියවරයන් ගත් වසරක් ලෙස 2015 වසර හැඳින්විය හැකි අතර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවති බව සඳහන් කිරීමට ලැබීම සතුටට කරුණක් වේ.

2015 වසර තුළ බස්රථ ඇණියට එක් කරන ලද නව බස්රථ සංඛ්‍යාවන් සමඟ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ධාවනයකරන ලද කි.මී. ප්‍රමාණය මිලියන 440 දක්වා 18.6 ක ප්‍රතිශතයකින් වැඩි වූ අතර සමස්ත මගී කි.මී. බිලියන 15.2 ක් දක්වා 19.6 ක ප්‍රතිශතයකින් වැඩි විය.

2015 වසර තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 5270 දක්වා වැඩි විය. මෙම වසර තුළ නුසුදුසු යැයි ප්‍රකාශ කරන ලද ගර්හිත බස් රථ සංඛ්‍යාව 1639අපහරණයකළහොත් ශ්‍රීලංගම සතු බස්රථ ඇණිය 8047 ක් වේ. මහා භාණ්ඩාගාරයේ සහාය ඇතිව ලබා ගත් නව බස් රථ සංඛ්‍යාව 2200 කින් ඉතිරි කොටස ඇණියට එකතු වීම, මෙම බස් රථ සංඛ්‍යාව ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර ඉන් බස් රථ 1319 ක් 2014 වසර අවසානයේදී ධාවනයට ලබා දෙන ලදි. ග්‍රාමීය මාර්ගවල ධාවනය කිරීම සඳහා කුඩා බස් රථ 80 ක්ද මෙයට ඇතුළත් විය.

2015 වසරේදී සාමාන්‍ය හා අර්ධ සුඛෝපභෝගී බස්රථ වලට අමතරව බස් රථ ඇණිය සහ අධි සුඛෝපභෝගී මගී ප්‍රවාහන සේවා පුළුල් කරන ලදී.

මෙවැනි සංවර්ධන කටයුතු පැවතියද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මෙහෙයුම් අලාභයන් සැලකිය යුතු අන්දමින් ඉහළ යන ලදී. නව බඳවා ගැනීම් නිසා වේතන ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2015 වසරේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සමස්ත ආදායම 6.4 ප්‍රතිශතයකින් රුපියල් බිලියන 35.8 දක්වා වර්ධනය විය. කෙසේ වුවද, 2015 වසරේ මෙහෙයුම් පිරිවැය 14.1 ප්‍රතිශතයකින් බිලියන 40.6 දක්වා ඉහළ ගිය අතර එය 2014 වසරේ සිදු වූ රුපියල් බිලියන 1.9 ක අලාභය හා සැසඳීමේදී රුපියල් බිලියන 4.8 ක මෙහෙයුම් අලාභයකි.

2015 වසරේ පාසල් සිසු දරුවන්ට සහ ඔවුන්ගේ දෙමව්පියන් හට වඩා සුරක්ෂිත, පිරිවැය ඵලදායි සහ විශ්වාසනීය ප්‍රවාහන පහසුකම් සැපයීමේ අරමුණින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද සිසු සැරිය ව්‍යාපෘතිය බස් රථ සේවා 1255 ක් සමගින් ක්‍රියාත්මක විය. මධ්‍යම රාත්‍රියේ සහ අලුයම් කාලයේ ගමන් ගන්නා මගීන් හට ආරක්ෂිත සේවාවක් සැපයීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද නිසි සැරිය ව්‍යාපෘතිය 2015 වසරේදී බස් රථ සේවා 134 ක් සමග ක්‍රියාත්මක කරන ලදි.

මම 2015 මාර්තු 23 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති ධුරයෙහි රාජකාරි දෙවන වරට බාර ගතිමි. පළමු අවස්ථාවේදී සභාපතිවරයා ලෙස 1994 සිට 2001 දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සේවය කළෙමි. මාගේ මූලික අරමුණුවලින් එකක් වූයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් ආයතනයක් බවට පත් කිරිමයි. කරුණු එසේ සිදු වෙද්දී ආණ්ඩුවේ සිදු වූ වෙනස්වීම් මත මම මගේ ධුරය අතහැර දැමුවෙමි. මෙවර මගේ සිහිනය යථාර්ථයක් බවට පත් කිරීමට මා හට හැකිවනු ඇතැයි සිතමි.

2015 මාර්තු මා ධුරය බාර ගන්නා විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බොහොමයක් සේවකයින්ගේ මාසික වැටුප ගෙවීම පිළිබඳ අර්බුදයකට මුහුණ දී සිටියහ. ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ගේ හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් රුපියල් බිලියන ගණනින් ඉහළගොස් තිබුණි. සේවක අර්ථ සාධක අරමුදලට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් සිදු කළයුතු ගෙවීම් සහ පාරිතෝෂික ආදිය නිරවුල් කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට මා හට හැකි වූ අතර, ඉදිරි වසර කීපය තුළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ශක්‍යතා වලින් සපිරුණු ආයතනයක් බවට පත් කිරීම මාගේ අරමුණ වේ.

ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ නොමසුරු සහයෝගය නොවන්නට මා විසින් ඉටු කරන ලද කාර්යයන් කිසිවක් සාර්ථක කරගැනීමට නොහැකි වනු ඇත. තවද ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාශයේ ලේකම්තුමාට සහ රේඛීය අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරින්ටද, භාණ්ඩාගාරයටහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සමස්ත කාර්යමණ්ඩලයට නන් අයුරින් සහාය දුන් අනෙකුත් සංවිධානවලට මම ස්තුතිවන්ත වෙමි.

ජාතියේ ගමන් සගයා වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ශ්‍රම බලකායට තව තවත් ජයග්‍රහණ ලඟාකර ගැනීමටත් ලබාගත් ජයග්‍රහණ ශක්තිමත්කර ගැනීමටත් ධෛර්යය හා ශක්තිය ලැබෙනු ඇතැයි මම අපේක්ෂා කරන අතර එසේ වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

රමාල් සිරිවර්ධන
සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ධාවන කොට්ඨාශය

බස් රථ ධාවනය තුලින් ලබා ගෙන ඇති ප්‍රගතිය

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය තුළ දෛනිකව ධාවනයට ලබාදෙනු ලබන බස්රථ ප්‍රමාණය ඉහළ නැංවීමට ශ්‍රී ලංගමයට හැකි වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාණ්ඩාගාර සහාය ලබමින් ශ්‍රී ලංගම විසින් නව බස්රථ 2,200 ක් මිලදී ගැනීම විය.

ඉහත තත්වයන් යටතේ මාසිකව ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය මිලියන 29 ක මට්ටමක සිට 39 ක මට්ටමක් දක්වා වැඩිකර ගැනීමට සමත් වී ඇත. මෙම වර්ෂය අවසන් වන විට මෙම මට්ටම තවදුරටත් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව පසුගිය කාලපරිච්ඡේදයේ මාසිකව ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය පහත පරිදි විය.

පසුගිය වර්ෂයේ දෛනික මාර්ගලේඛන ආදායම සාමාන්‍යයෙන් රු. මිලියන 60 ක මට්ටමක පැවති අතර 2015 වර්ෂයේ රු. මිලියන 65 ක් දක්වා වර්ධනය කර ගැනීමට සමත් වී ඇත.

- ත්‍රෛයි භාෂා නාමපුවරු සහිත බස්රථ 2,200 ක් හඳුන්වා දීම සිදු කළ අතර, දිවයිනේ සෑම ප්‍රදේශයකටම ගැලපෙන නාම පුවරු හඳුන්වා දීම මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් ජාතික භාෂා ප්‍රතිපත්තිය තහවුරු කිරීම මෙන්ම සමාජ සහජීවනය සඳහා ද අවකාශ සැලසෙන බැවින් ඉදිරියේදී මිලට ගැනීමට නියමිත සෑම බස්රථයක් සඳහාම මෙම ව්‍යාපෘතිය යටතේ ත්‍රෛයිභාෂා නාම පුවරු සවිකිරීමට කටයුතු කරමින් සිටී.

- රාත්‍රී අවසන් ගමන් වාර අඛණ්ඩව ධාවනය කිරීම යටතේ පිටකොටුවේ මධ්‍යම බස්රථ නැවතුමේ සිට රාත්‍රී 10.00 ට බස්රථ සේවාවන් ආරම්භ කළ අතර, ගමනාන්ත 30 ක් කරා මෙම බස්රථ ධාවනය කිරීම සිදුකරනු ලබයි.

- ශ්‍රී ලංගම හා දුම්රිය ඒකාබද්ධ සේවය වර්ධනය කිරීම යටතේ දෙල්ගොඩ, කළුතර, මොරටුව, දෙහිවල, කොල්ලුපිටිය යන දුම්රිය ස්ථාන වල සිට දුම්රිය ස්ථාන වලින් පැමිණෙන මගීන්ගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කිරීමට පියවර ගැනීම.

- GPRS පහසුකම්යොදාගනිමින්බස්රථනිරීක්ෂණයකිරීමආරම්භකළඅතර,අළුතින්මිලටගත්බස්රථ2,200සඳහාමෙමපහසුකමසම්බන්ධකරඇත.ඒඅනුවබස්රථපවතිනස්ථානයඉන්ධනදහනයපිළිබඳතොරතුරුහාරථයතුලසිටිනමගීන්පිළිබඳතොරතුරුලබාගැනීමටහැකියාවහිමිවීඇත.

- පාසල් ළමුන්ගේ වාර ප්‍රවේශපත්‍ර වෙනුවට ඉලෙක්ට්‍රොනික් ප්‍රවේශපත්‍ර හඳුන්වා දීම පසුගිය වර්ෂයේ ආරම්භ කළ අතර එය මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

- අනුරාධපුර පූජා නගරය මුල්කරගනිමින් ශ්‍රී ලංගම මගින් විශේෂ බස්රථ සේවාවක් ආරම්භ කිරීම සිදු කළ අතර, උදෑසන 6.00 සිට 7.00 දක්වා විනාඩි 45 කට වරක් මෙම ක්‍රියාව ක්‍රියාවට නංවා ඇත. සාමාන්‍ය බස්රථ 02 ක් හා සුඛෝපභෝගී බස්රථ 02 ක් මේ සඳහා යොමුකර ඇත.

- 2014 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංගම සතුව ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර 2,800 ක් පැවති අතර, එම ප්‍රමාණය 3,700 ක් දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය ටිකට් යන්ත්‍ර 900 ක් මිලට ගැනීම 2015 වර්ෂයේ මුල් මාස හය තුළ සිදු විය.

- ශ්‍රී ලංගම විසින් අධිසුඛෝපභෝගී බස්රථ මිලට ගෙන දක්ෂිණ හා කටුනායක අධිවේගී මාර්ග භාවිතා කරමින් නගරාන්තර සේවා රැසක් සැපයීමට කටයුතු කර ඇත. අධිවේගී මාර්ග තුල මෙන්ම ඉන් පිටපතදීත් අධි සුඛෝපභෝගී සේවා සැපයීමට ශ්‍රී ලංගමයට හැකි වී ඇත. මෙම බස්රථ සඳහා මේ වන විට විශාල මගී ඉල්ලුමක් නිර්මාණය වී ඇත.

- සිසුසැරිය පාසල් බස්රථ සේවාව යටතේ 2014 වර්ෂය අවසන් වන විට පාසල් බස්රථ 662 ධාවනයට ලබාදී තිබුණි. මෙය වර්ධනය කරමින් 2015 වර්ෂයේ මේ වන විට පාසල් බස්රථ 750 ක් දක්වා වැඩිකිරීමට පියවර ගෙන ඇත. මෙම බස්රථ එක් එක් ප්‍රාදේශිකයන් තුල ක්‍රියාවට නංවා ඇති ආකාරය පහත පරිදි වේ.

සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය

- **අලුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර ධාවනය**
  ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශයක්ම ආවරණය වන පරිදි අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන් වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායක වන නමුත් මෙම සේවාව මගින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇති ලාභයක් නොමැති තරම් වේ. නමුත් ශ්‍රී ලංගම සිදුකරනු ලබන තවත් සමාජයීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

- **ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ධාවනය**
  ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීම සඳහා ගම හා නගරය යා කිරීමේ ප්‍රබලතම ගමනාගමන මාධ්‍ය ලෙස ක්‍රියාත්මක වන සේවාද අලාභදායී තත්වයන් යටතේ සිදු කරයි. ඒ අනුව පසුගිය වර්ෂයේ මිලට ගත් කුඩා බස්රථ 281 ක් උපයෝගී කරගනිමින් ග්‍රාමීය මාර්ග සේවා තරකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. තවදුරටත් මෙම කුඩා බස්රථ මිලට ගනිමින් මෙම සේවාව තර කිරීමට පියවර ගනිමින් සිටිනුයේ එය මේ රටේ ග්‍රාමීය ආර්ථිකයේ ස්වාධීනත්වයට අත්‍යාවශ්‍ය සේවාවක් බැවිනි.

- **පාසැල් සේවා බස්රථ ධාවනය**
  ශ්‍රී ලංගම මගින් දරණ බරපැන තුලින් දැයේ හෙට දිනය වෙනුවෙන් සමාජ ප්‍රතිලාභ ඇති කිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මගී තදබදය අධික සහ ලාභ ඉපයීම සිදුකර ගත හැකි අවස්ථා රැසක් අහිමි කරගනිමින් වුවද අප සතුව ඇති සීමිත බස් රථ ඇණිය තුල වැඩි ඉඩකඩක් දැයේ අනාගත පරපුර වන පාසල් සිසු දරු දැරියන් නියමිත වේලාවට පාසලට ගෙන යාම සහ නිවසට ගෙන ඒම සඳහා වෙන්කර ඇති අතර මෙයද ශ්‍රී ලංගමයේ තවත් සමාජීය හා ජාතික මෙහෙවරකි.

- **ජාතික උත්සව අවස්ථාවල සිදුකරනු ලබන බස්රථ ධාවනය**
  සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය, වෙසක් හා පොසොන් උත්සවය, මහනුවර හා කතරගම ඇසළ පෙරහැර උත්සවය, වාර්ෂික මඩු හා තලවිල මංගල්‍යය, ශ්‍රී පාද වන්දනා සමය වැනි ආගමික වශයෙන් වැදගත් දිනයන් සඳහා සිදු කරනු විශේෂ බස්රථ සේවා ශ්‍රී ලංගමය මගින් සමාජ සත්කාරක සේවාවන් ලෙස ක්‍රියාත්මක වේ.

- **වාර ප්‍රවේශ පත්‍ර සේවා**
  පාසැල්, විශ්ව විද්‍යාල හා වැඩිහිටි වශයෙන් වෙන් කරමින් විවිධ මට්ටම් තුලින් ප්‍රවාහන අවශ්‍යතා ලබාදීමට ශ්‍රී ලංගම ගෙන ඇති ක්‍රියාමාර්ග මගින් රටේ සිටින මගී ජනතාවට ආර්ථික වශයෙන් සහන සැලසීම සිදුකරයි. පැරණි වාර ප්‍රවේශපත්‍ර වෙනුවට නවීන තාක්ෂණික ඉලෙක්ට්‍රොනික වාර ප්‍රවේශපත්‍රයන් හඳුන්වාදීම ශ්‍රී ලංගම මගින් ආරම්භ කර ඇති අතර, මේ වන විට කොළඹ, ගම්පහ, කළුතර හා කතරගම යන ප්‍රදේශවල මෙම ක්‍රමය හඳුන්වා දී ඇත.

- **අධිවේගී මාර්ගයන් තුල ප්‍රවාහන සේවා**
  ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතියට අළුතින් හඳුන්වා දුන් අධිවේගී මාර්ග පද්ධතිය තුල ධාවනය කිරීමට නිර්දේශිත බස්රථ යොදාගනිමින් මගී ප්‍රවාහන කටයුතු වල නියැලීමට ශ්‍රී ලංගමය සමත් වී ඇත. ඒ අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග පද්ධතිය හරහා ගමන් කරනු ලබන අපගේ සුඛෝපභෝගී බස්රථ පද්ධතිය නවීන ලෝකයට ගැලපෙන පරිදි සකස් වී ඇත.

- **සමාන්තර මගී සේවා හදිසි බිඳ වැටීම් වලදී ශ්‍රී ලංගම සේවා**
  සමාන්තර ප්‍රවාහන සේවාවන්හි විටින් විට සිදුවන විවිධ අඩපන වීම් තුල අසරණ වන මගී ජනතාවට විශේෂ සහන සේවා සපයන්නේද ශ්‍රී ලංගමයයි. ශ්‍රී ලංගම සතුව රථ ඇණිය ගමේත් නගරයේත් ධාවනය කරමින් විවිධ අවස්ථා වලදී අසරණ වන ජනතාවට ප්‍රවාහන පහසුකම් සලසයි.

ලේකම් කොට්ඨාශය

<u>2015 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන</u>

01 වන රැස්වීම	-	2015.03.01
02 වන රැස්වීම	-	2015.03.31
03 වන රැස්වීම	-	2015.04.07
04 වන රැස්වීම	-	2015.04.29
05 වන රැස්වීම	-	2015.05.12
06 වන රැස්වීම	-	2015.05.29
07 වන රැස්වීම	-	2015.06.26
හදිසි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	-	2015.07.14
08 වන රැස්වීම	-	2015.08.06
09 වන රැස්වීම	-	2015.08.27
10 වන රැස්වීම	-	2015.10.22
11 වන රැස්වීම	-	2015.11.19
විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	-	2015.12.01

2015 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ වාර ගණන - 13 යි

හදිසි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 01 ක් ද, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 01 ක් ද, ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 13 ක් පවත්වා ඇත.

හේෂාන් කේටර්ස් පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංගම බස්රථ කාර්යාලයේ පිහිටි මගී ලැගුම්හල වර්ෂ 2015.12.21 සිට 2020.12.21 දක්වා බදු පදනම මත ලබාදී ඇත.

1 වන වසර තුළ මසකට	-	120,000 x 12
2 වන වසර තුළ මසකට	-	120,000 x 12
3 වන වසර තුළ මසකට	-	135,000 x 12
4 වන වසර තුළ මසකට	-	135,000 x 12
5 වන වසර තුළ මසකට	-	135,000 x 12

2015/ 2015 මහ කන්නයේ වී ගබඩා කිරීම සඳහා මැදවච්චිය ප්‍රාදේශීය වැඩපොළ ශාලා අංක 02 ගබඩාව මාස 03 ක බදු පදනම මත මාසික කුලී තක්සේරු රු. 250,000/- ක මුදලකට ලබාදීමට කටයුතු ආරම්භ කිරීම.

<u>රත්මලාන ඉඩම</u>

අංක 546 දරණ සැලැස්මේ සඳහන් කර ඇති පර්චස් 26.50 ක් වන මෙම බිම් කොටස රත්මලාන දෙහිවල ප්‍රාදේශීය උප දිසාපති කාර්යාලය පිහිටුවීම සඳහා 1988.07.18 දින එවකට ශ්‍රී ලංගම සභාපති තැන විසින් රත්මලාන, දෙහිවල සහකාර ඒජන්ත තැන වෙත භාරදී ඇති නමුත්, ඒ සඳහා කිසිදු වාරික මුදලක් හෝ මුදල් ප්‍රදානයක් ශ්‍රී ලංගම වෙත ලැබී නැති බව හා එම වන්දි මුදල හෝ ප්‍රදානයන් ලබාගැනීම සඳහා කටයුතු කරමින් සිටින බව සඳහන් කරමි. මේ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් දැනුවත් කර ඇත. රත්මලාන ප්‍රාදේශීය ලේකම් විසින් මෙම මුදල් ප්‍රදානය හැකි ඉක්මනින් ලබාදෙන බවට වාචිකව පවසා ඇත.

<u>රත්මලාන ඉඩම</u>

රත්මලාන, ගාලුපාර, අංක 175 දරණ ශ්‍රී ලංගම ඉඩම අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විඳින කැබඩි අංක 82, 83 අනවසර පදිංචිකරුවන් හට ලබාදී ඇති හිමිකම් සහතික අවලංගු කරන ලෙස ඉල්ලා හිමිකම් නිරවුල් කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වෙතින් එම සහතික ලබා නොදීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. බිම් කැබලි අංක - 82, 83 ට නීත්‍යානුකූල නොවන ලෙස ලබාදී ඇති හිමිකම් අවලංගු කිරීමට නීතිමය පියවර ගනිමින් සිටීම.

ශ්‍රී ලංගම දෙල්ගොඩ බස්නැවතුම්පොළ සඳහා අක්. 1 රූඩ්.2 පර්.15.5 ක ඉඩම් කොටස සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 460 පරිච්ඡේදය හා 44 වෙනි වගන්තිය යටතේ පැවරුම් සහතිකය බියගම ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගැනීමට කටයුතු කර ඇත.

<u>හඳුනාගත් ඉඩම් කොටස් 13 සම්බන්ධව</u>

2015.11.06 දින ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී ගත් තීරණය මත සේවක අර්ථසාධක අරමුදලට ශ්‍රී ලංගමය විසින් ගෙවිය යුතු සමුච්චිත හිඟ දායක මුදල් ගෙවීම සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි හඳුනාගත් ඉඩම් කොටස් 13 සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන තිබූ ඉඩම් කොටස් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් දීමනා පත්‍ර ලබාගැනීම අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය හිමි විය.

ඉහත ඉඩම් කොටස් 13 සඳහා නොදියුණු තක්සේරු වටිනාකම සහිත තක්සේරු වාර්තා 10 පහත සඳහන් කර ඇත.

	ඉඩම	නොදියුණු තක්සේරු වටිනාකම (රුපියල් මිලියන)
i	හෝමාගම ඩිපෝ ඉඩම	164.00
ii	මහරගම ඩිපෝ ඉඩම	410.00
iii	මොරටුව ලක්ෂපතිය (උතුර) පිහිටි ශ්‍රී ලංගම මොරටුව ඩිපෝව, කටුබැද්ද ඩිපෝව, යුධ හමුදාවට භාරදී ඇති ඉඩම, සී/ස සියරා සුබෝපභෝගී බස් ඩිපෝව ආදිය පිහිටි අක්කර 19 ක පමණ ඉඩම	1,660.00
iv	ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට අත්කරගත්	750.00

	ඉඩම	
v	මොරටුව රියදුරු විද්‍යාලය පිහිටි ඉඩම	200.00
vi	ශ්‍රී ලංගම කැස්බෑව ඩිපෝව පිහිටි ඉඩම	518.00
vii	පිළියන්දල බස් නැවතුම්පොළ පිහිටි ඉඩම	322.50
viii	වේරහැර වැඩපොළේ ළිඳ සඳහා අත්කරගත් ඉඩම	34.00
ix	මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම	1,192.00
x	වේරහැර මධ්‍යම වැඩපලට අයත්ව තිබූ (කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ශික්ෂණ රෝහල, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ධාවන පථය පිහිටි ඉඩම)	5,000.00
	එකතුව	**10,250.50**

<u>පාගොඩ පිටකෝට්ටේ බස් නැවතුම්පොළ</u>

ශ්‍රී ලංගම පාගොඩ පිටකෝට්ටේ බස් නැවතුම්පොළ ඉඩම (අක්.0 රූඩ්.0 පර්.22.6) විශාල ඉඩම කොළඹ නගර සභාව වෙත බදු පදනම මත ලබාදීම. වර්ෂික බදු කුළිය රු. 10,000,000/-

<u>බූන්ඩියමුල්ල</u>

ගම්පහ, බූන්ඩියමුල්ල පිහිටි ශ්‍රී ලංගම ප්‍රාදේශීය වැඩපල පිහිටි ඉඩම අක්. 0 රූඩ්. 3 පර්. 21.6 ක ඉඩමෙන් පර්. 30 ක බිම් කොටසක් ලබා දෙන ලෙස ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා අමාත්‍යාංශ අනුමැතිය ලබාදී ඇති අතර, ඒ සඳහා කටයුතු කරමින් පවතී.

අක්. 0 රූඩ්. 3 පර්. 216 සඳහා ප්‍රකාශන ඔප්පුවක් 2016.01.26 දින සකසා ලියාපදිංචි කොට ඇත.

<u>ම.බ.කා කඩ කාමර</u>

1986 වර්ෂයෙන් පසු මධ්‍යම බස්රථ කාර්යාලයට අයත් වෙළෙඳ පරිශ්‍රවල කඩකාමර කුළිය වැඩි කිරීම.

මෙහිදී නියමිත ක්‍රමවේදයක් අනුගමනය නොකර ලබාදී තිබූ වෙළෙඳ ස්ථාන සඳහා බදු ගිවිසුම් අධ්‍යයනය කරන ලදී. ඉන් අනතුරුව කොළඹ මහ නගරසභා තක්සේරු වටිනාකම සැලකිල්ලට ගෙන ව්‍යාපාරික අදහස් ද විමසා නව බදු කුලී සංශෝධනය කරන ලදී. මෙම සංශෝධනයට අනුව වැඩි වූ මාසික කුලිය රු. 431,237.30 කි.

<u>කොග්ගල පැරණි බස් නැවතුම්පොළ පිහිටි ඉඩම</u>

2015.11.19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංගම හිඟ පාරිතෝෂික ගෙවීම සඳහා කොග්ගල පැරණි බස් නැවතුම්පොළ පිහිටි ඉඩම බාහිර පාර්ශවයකට විකිණීම සඳහා තක්සේරු වාර්තාවක් 2016.01.24 දින ලබාගැනීමට කටයුතු කර ඇත. මෙම ඉඩමේ තක්සේරු වටිනාකම රු. 66,500,000/- (හය කෝටි හැටපන් ලක්ෂයක්) ලෙස තක්සේරු වාර්තා කර ඇත.

<u>කඩවත පැරණි ඩිපෝ ඉඩම</u>

ගම්පහ දිසා අධිකරණ නඩු තීන්දුව අනුව ශ්‍රී ලංගම වෙත ලැබී ඇති ඉඩම 2016.06.18 දින පත්තිරු ගෙන ලියාපදිංචි කරන ලදී.

<u>බදුල්ල හිඳගොඩ ඉඩම</u>

ශ්‍රී ලංගම බදුල්ල හිඳගොඩ තන්තිරිගේවත්ත ඉඩමෙන් කේ.ජී. පියසේන මහතාගේ ඉඩමට යාම සඳහා පාරක් බදු දීම සම්බන්ධයෙන් ඇති වූ ගැටළු නිරාකරණය කිරීමෙන් පසු ඔහුගේ ව්‍යාජ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී අගතියට පත්කර ඉඩම සඳහා කේවියට් තහනමක් පනවන ලදී.

බදුල්ල ශ්‍රී ලංගම ඉඩමේ ඒෂියා ග්‍රේට් යුනිකෝන් සමාගම වෙත ලබාදුන් බදු ගිවිසුමට අනුව 1998.10.01 සිට 2014.09.30 දක්වා කාලය තුළ ගෙවිය යුතු හිඟ බදු මුදල රු. 1,470,000/- කි. 2015.03.30 වන දින ශ්‍රී ලංගම විසින් අයකරගන්නා ලදී.

ශ්‍රී ලංගම අවිස්සාවේල්ල ඩිපෝවෙන් කුඩගම මාර්ගය පුළුල් කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් කොටස සඳහා රු. 3,569,975/- ක් 2015.10.28 දිනැති චෙක්පත මගින් ශ්‍රී ලංගම වෙත වන්දි මුදල් අයකරගන්නා ලදී.

ශ්‍රී ලංගම වේරහැර ඉඩමෙන් කොළඹ - හොරණ මාර්ග පුළුල් කිරීම සඳහා මු.පි.කො. 9258 කැබලි අංක - 242, 243 හා 303 ඉඩම් කොටස් අත්පත් කරගැනීම සඳහා වන්දි මුදල් වශයෙන් රු. 11,760,858/- ශ්‍රී ලංගම වෙත ලබා ගැනීම.

ශ්‍රී ලංගම රත්නපුර ඩිපෝ ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා 44 වන වගන්තිය යටතේ බලය පැවරීමේ සහතිකය නිකුත් කළ ආරම්භ දින වල සිටම අස්ථානගතව තිබූ අතර එම සහතිකය දිස්ත්‍රික් ලේකම් තැනගෙන් ලබාගැනීම.

තවද, රත්නපුර ඩිපෝ ඉඩමෙන් පර්. 228.46 යෝජිත අධිවේගී මාර්ගය සඳහා පවරාදීමට කටයුතු කිරීම මගින් වන්දි මුදල් වශයෙන් රු. 103,786,844.40 වන්දි හිමිකම් ලෙස ඉල්ලීම් කොට ඇත.

<u>හැටන් ඩිපෝව</u>

හැටන් ඩිපෝවට අයත් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා නීතිමය කටයුතු සිදුකරමින් පවතී. තවද, මෙම ඉඩම මැන තහවුරු කිරීමට කටයුතු කළ අතර, මෙහි කොටසක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

ආරක්ෂක අංශය

1. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගම අයත් ආයතනයන් වෙත ආරක්ෂාව සැපයීම.

2. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය කාර්යාලයන්, ඩිපෝවන්, උප ඩිපෝවන්, ප්‍රාදේශීය වැඩපලවල් හා රියදුරු අභ්‍යාස විද්‍යාල යන සියලුම සේවා ස්ථානයන්ට අයත්ව ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි හා මගී ජනතාව මගින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කිරීම.

3. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගමට අයත් ආයතනයන් වෙත ගිනි නිවන උපකරණ සැපයීම/ අළුත්වැඩියා කිරීම/ අධීක්ෂණය කිරීම්.

4. ශ්‍රී ලංගම අයත් නඩු ඇපකරයන් වලට මුදල් බැඳීමේදී හා ප්‍රධාන කාර්යාලය සතුව කෙරෙන මූල්‍ය කටයුතු සඳහා දෛනික වශයෙන් ආරක්ෂාව ලබාදීම.

5. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඇතුලු සියලුම සේවා ස්ථානයන් වල සේවක මහත්ම/ මහත්මීන් වෙත නිදහස් ගමන් බලපත්‍ර බෙදා හැරීම් කටයුතු සිදු කිරීම.

6. ශ්‍රී ලංගමට අයත් ආයතනයන්හි වැදගත් ස්ථාන හා ප්‍රභූ ආරක්ෂාව සැපයීම, රථ වාහන නැවැත්වීම, පාලනය කිරීම අදාල ආයතනයන් වෙත කරනු ලබන සියලුම සැපයීම් හා නිකුත් කිරීම් අධීක්ෂණය කිරීම.

7. ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් ආයතන වෙත එනම්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික වෛද්‍ය මධ්‍යස්ථානය වෙත ආරක්ෂාව සැපයීම හා එමගින් ආදායමක් ඉපැයීම.

විශේෂ විමර්ශණ ඒකකය

වර්ෂය	නිම කර ඇති විමර්ශන
2015	50

2015 වර්ෂය සඳහා හදිසි ඩිපෝ පරීක්ෂණ හා බස්රථ පරීක්ෂාවන්ද, බස්ගාල් පරීක්ෂාවන්ද කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

කාර්මික අංශය

<u>බස්රථ ඇණිය පවත්වාගෙන යාම සඳහා අලුත්වැඩියා කරන ලද එන්ජින්</u>

අලුත්වැඩියා කළ එන්ජින් ප්‍රමාණය	613
අලුත්වැඩියා කළ ගියර් පෙට්ටි ප්‍රමාණය	413
අලුත්වැඩියා කළ බස් බොඩි ප්‍රමාණය	272
ලබාගන්නා ලද නව බස්රථ ප්‍රමාණය	1937
අම්පාර ටයර් කර්මාන්ත ශාලාව මගින් නිපදවන ලද පෙරසවි ටයර් ප්‍රමාණය	12191
අලුත්වැඩියා කළ බස්බොඩි කොටස්	3204
අලුත්වැඩියා කළ ඉන්ධන පොම්ප	413

අභ්‍යන්තර විගණන අංශය

<u>මුදල් අංශය</u>

1. 2015 වර්ෂයේ විගණන සැලසුම හා විගණන වැඩසටහන සකස් කිරීම
2. මුදල් සමීක්ෂණය
3. මුදල් පොත් පරීක්ෂාව
4. වේතන අතිකාල පරීක්ෂාව
5. වේතන/උත්සව අත්තිකාරම් පරීක්ෂාව
6. කොන්දොස්තර හිඟ මුදල් පරීක්ෂාව
7. පාරිතෝෂික ගෙවීම් පරීක්ෂාව
8. දෛනික එකතු කිරීමේ ලේඛන පරීක්ෂාව

9. දේශීය මිලදී ගැනීම් පරීක්ෂාව
10. අවසාන ගිණුම් විගණනය
11. ගිණුම් අංශයේ අනිකුත් ලේඛන පරීක්ෂාව

<u>තොග ගබඩාව</u>

1. වාර ප්‍රවේශ පත්‍ර ලේඛන පරීක්ෂාව
2. ගබඩා සමීක්ෂණය
3. ඉන්ධන පරිභෝජන පරීක්ෂාව
4. අමතර කොටස් පරිභෝජනය පරීක්ෂාව
5. ටයර් පරිභෝජනය පරීක්ෂාව
6. දූණු කොළ පරිභෝජනය පරීක්ෂාව
7. අපහරණ කටයුතු

<u>ධාවන අංශය</u>

1. මාර්ග ලේඛන පරීක්ෂාව
2. අනතුරු ලේඛන පරීක්ෂාව
3. කාර්ය වක්‍ර ලේඛන පරීක්ෂාව
4. ධා/51, ධා/50, ධා/40, ධා/41 ලේඛන පරීක්ෂාව

<u>ඉංජිනේරු අංශය</u>

1. ආපදා අළුත්වැඩියාව
2. අමතර කොටස් අධික පරිභෝජනය
3. අකාලයේ අසාර්ථක වන අමතර කොටස් පරීක්ෂාව
4. ඉංජිනේරු අංශයේ අනිකුත් ලේඛන පරීක්ෂාව

<u>වෙනත්</u>

1. විනය ලේඛන පරීක්ෂාව
2. නිවාඩු ලේඛන පරීක්ෂාව
3. මණ්ඩලීය වත්කම් පරීක්ෂාව
4. රියදුරු අභ්‍යාස විද්‍යාල වල ආදායම්, වියදම්, නඩත්තු හා පාලන යන අංශ විගණනයට ලක් කිරීම
5. සංචාරක නිවාඩු නිකේතන පරීක්ෂාව
6. ශාලිකා ශාලාව හා ක්‍රීඩාංගනය පරීක්ෂාව
7. ප්‍රධාන කාර්යාලයේ පොදු කාර්ය වියදම් විශ්ලේෂණය (ජලය, දුරකථන, විදුලිය, ලිපිද්‍රව්‍ය)
8. රාජ්‍ය ප්‍රතිපත්ති හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති
9. ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකවරුන්ගේ මාසික සාකච්ඡා පැවැත්වීම
10. ත්‍රෛයිමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම
11. සභාපතිතුමා විසින් යොමු කරන විශේෂ පරීක්ෂණ
12. ප්‍රාදේශීය ඒකක වල වාර්ෂික විගණන සාකච්ඡා පැවැත්වීම.

මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය

2015 වර්ෂයෙහි ලබාදුන් රියදුරු/ කොන්දොස්තර නව පත්වීම් පිළිබඳ විස්තර වාර්තාව		
රියදුරු සංඛ්‍යාව	කොන්දොස්තර සංඛ්‍යාව	එකතුව
770	**628**	**1398**

විධායක/ විධායක නොවන සේවකයින්ගේ සේවය දීර්ඝ කිරීම - 2015

කොන්ත්‍රාත් පදනම මත	29
කාර්ය පැවරුම් මත	56
2015 අංක 01 දරණ මාසක කොට්ඨාශ වක්‍රලේඛනය අනුව සේවය දීර්ඝ කිරීම්	206
එකතුව	291

විධායක පත්වීම් පිළිබඳ විස්තරය - 2015

	2015
ස්ථිර පත්වීම්	16
ආවරණ පත්වීම්	131
උසස්වීම්	08
ආවරණ පත්වීම් ස්ථිර කිරීම	19
ස්ථාන මාරුවීම්	167
කොන්ත්‍රාත් පත්වීම්	06
නව බඳවා ගැනීම්	0

2015.12.31 දිනට ශ්‍රී ලංගම සිටින සේවක සංඛ්‍යාව

	2015.12.31 දිනට
විධායක	1197
විධායක නොවන	8493
රියදුරු	10563
කොන්දොස්තර	10532
කාර්මික	5001

පුහුණු	71
එකතුව	35857

2015 වර්ෂයේ නැවත රැකියා පිළිබඳ සාරාංශය

අනු අංකය	තනතුර	ප්‍රතිෂ්ඨාපනය	කොන්ත්‍රාත්	අනියම්	එකතුව
1	රියදුරු	381	49	9	439
2	කොන්දොස්තර	236	31	4	271
3	කාර්මික	97	17	1	115
4	රිය/කොන්/කාර් හැර	204	57	6	2671
	එකතුව	918	154	20	1092

ජංගම පරීක්ෂණ අංශය

2015 වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (දිවයින පුරා)

මාසය	කණ්ඩායම් ගණන	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව	බරපතල විෂමාචාර (IV)	සුළු විෂමාචාර (V)	දඩ ගෙවූ මගීන් ගණන	අයකර ගත් දඩ මුදල රු.
ජනවාරි	38	766	10,460	49	112	324	108,297.00
පෙබරවාරි	67	814	11,237	56	154	363	121,004.00
මාර්තු	84	780	11,409	73	222	489	158,183.00
අප්‍රේල්	117	934	15,046	73	378	702	246,080.00
මැයි	98	965	12,781	81	248	499	169,099.00
ජුනි	109	968	14,282	87	271	618	202,158.00
ජූලි	108	1,211	16,408	74	416	601	201,105.00
අගෝස්තු	97	1,170	15,851	82	381	586	199,348.00
සැප්තැම්බර්	108	1,323	17,812	100	554	741	242,159.00
ඔක්තොම්බර්	124	1,389	18,972	93	528	690	240,534.00
නොවැම්බර්	117	1,200	17,584	69	412	585	194,530.00
දෙසැම්බර්	127	1,254	18,059	94	412	662	236406.00
	1,194	**12,774**	**179,901**	**931**	**4,088**	**6,860**	**2,318,903.00**

2015 වර්ෂය තුල ජංගම පරීක්ෂණ ප්‍රගති වාර්ථාව (මධ්‍යම ජංගම අංශය)

මාසය	කණ්ඩායම් ගණන	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස්රථ සංඛ්‍යාව	බරපතල විෂමාචාර (IV)	සුළු විෂමාචාර (V)	දඩ ගෙවූ මගීන් ගණන	අයකර ගත් දඩ මුදල රු.
ජනවාරි	05	63	827	15	15	38	13,356.00
පෙබරවාරි	05	77	1,273	27	27	96	31,312.00
මාර්තු	05	79	1,321	37	43	130	42,347.00
අප්‍රේල්	05	77	1,403	23	29	126	43,562.00
මැයි	05	79	1,392	30	23	93	30,702.00
ජූනි	05	93	1,515	29	22	91	31,556.00
ජූලි	05	81	1,441	17	26	64	23,050.00
අගෝස්තු	05	68	1,247	20	23	74	23,836.00
සැප්තැම්බර්	05	70	1,227	27	25	73	15,710.00
ඔක්තොම්බර්	05	77	1,077	22	28	53	20,294.00
නොවැම්බර්	05	69	1,086	12	35	49	18,004.00
දෙසැම්බර්	05	75	1,252	24	38	63	23,169.00
		908	**15,061**	**284**	**334**	**950**	**319,898.00**

සැලසුම් අංශය

1. අයවැය පාදක කරගනිමින් ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම.
2. අයවැ පාදක කරගනිමින් ඉදිරි වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලසුම් සකස් කිරීම.
3. ක්‍රියාකාරී සැලසුමට අදාලව මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
4. ක්‍රියාකාරී සැලසුමට අදාල කාර්තු ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
5. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ඉල්ලුම් කරන විවිධ වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
6. ශ්‍රී ලංගම මහ බැංකුව හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම් කරන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
7. අනිකුත් රාජ්‍ය ආයතන මගින් ඉල්ලුම් කරන වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
8. මාසික ලාභාලාභ වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීම.
9. මාසිකව ලාභාලාභ වාර්තාවට අදාල සාරාංශ පිළියෙල කර ඉදිරිපත් කිරීම.
10. මාසික වාර ප්‍රවේශපත්‍ර වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීම.
11. බැරකම් වාර්තා ඉදිරිපත් කිරීම.

ටෙන්ඩර් මණ්ඩලය

අනු අංකය	ප්‍රසම්පාදන අංකය	සිදු කළ ක්‍රියාකාරකම්	වර්තමාන තත්වය හා ප්‍රගතිය
01	SLTB/TS/GEN/2015/02 I	Quotation For The Procurement of Motor Spare Parts To S.L.T.B – 2015	මෙහි මේ දක්වා මිලදී ගැනීම් කටයුතු සිදු කරයි.
02	SLTB/TS/GEN/2015/19 II	Quotation For Toners, Cartridges & Ink Ribbons for SLTB Head Office	අවසන් වී නොමැත.
03	SLTB/TS/GEN/2015/19 I	Quotation for stationery Items for SLTB Head Office	අවසන් වී නොමැත.
04	SLTB/TS/GEN/2015/19 III	Quotation for the purchase of 2200 Nos. Pen Drivers for SLTB	අවසන්.
05	SLTB/TS/GEN/65/2015	අධිසුඛෝපභෝගී (යූටෝන්ග්) බස්රථ සඳහා නව ටයර් මිලදී ගැනීමට මිළ ගණන් කැඳවීම.	මිලදී ගෙන ඇත්තේ 204 ක ප්‍රමාණයකි.
06	SLTB/TS/GEN/65 I/2015	අධිවේගී මාර්ගයේ ධාවනය කරනු ලබන ලේලන්ඩ් සුඛෝපභෝගී බස්රථ සඳහා ටයර් කිට් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	මිලදී ගැනීම් තාවකාලිකව නවතා ඇත.
07	SLTB/TS/GEN/07/2015	Quotation For Fuel Pumps For Orugodawatta&Rathmalana Fuel Filling Stations.	දෙවන වර මිල කැඳවීමක් කර ඇත.
08	SLTB/TS/GEN/28/2015	Bid For the Supply & Delivery of 4100 Nos. New Batteries or Batteries of acid.	ඩිපෝ අවශ්‍යතාවය මත ලබාගෙන ඇත.
09	SLTB/TS/GEN/12(I)/2015	අම්පාර ටයර් කම්හලේ නිෂ්පාදන කටයුතු සඳහා මාසික අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම සහ ප්‍රවාහනය කිරීම.	තවම මිලදී ගැනීම් සිදුවෙමින් පවතී.
10	SLTB/TS/GEN/07(I)/2015	Quotation For Supply, Delivery and Installation of an underground fuel Tank and Dispensing pump For Samanthurai Depot, Orugodawatta&Rathmalana.	ටෙන්ඩර් මණ්ඩල අනුමත මිල ගණන් යටතේ රත්මලාන පිරවුම් හල සඳහා පමණක් ඉන්ධන පොම්ප 02 ක් ලබාගෙන ඇත.
11	SLTB/TS/GEN/2015/76	Quotation For the purchase of 01 No. of Digital Camera For SLTB	අවසන්.
12	SLTB/TS/GEN/2015/78	ශ්‍රී ලංගම මධ්‍යම බස්රථ කාර්යාලයට අවශ්‍ය වතුර මෝටර් 02 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම	අනුමත කර ඇත.
13	SLTB/TS/Civil/2015/16(I)	Quotation For Internal Plastering of Water Sump at CBS – Pettah.	කාර්ය සිදු කර නොමැත.
14	SLTB/TS/GEN/2015-2	Quotation For the Supply & Delivery of bus Body Building Materials For the Provincial Workshops.	අවසන්.
15	SLTB/TS/GEN/2015- Rexene	ශ්‍රී ලංගම බස්රථ වල මගී ආසන සඳහා රෙක්සින් මිලදී ගැනීම.	ඩිපෝ සහ ප්‍රාදේශීය වැඩපොළ වල අවශ්‍යතාවය මත ලබාගෙන ඇත.
16	SLTB/TS/GEN/80/2015	දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගම ඩිපෝවන්හි ඇති සේවක විවේකාගාර සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ	අවසන්

		මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	
17	SLTB/TS/GEN/10/2015	Quotation For the Supply & Delivery Installation of 100 Nos. Electronic Devices For SLTB super Luxury Buses.	මිලදී ගෙන නැත.
18	SLTB/TS/Civil/2015/16 II	Quotation for Earth filing to Shalika Ground.	කාර්යය සිදුකර නැත
19	SLTB/TS/Civil/2015/16 III	Construction of Rubble Service Ramp Dambulla Depot.	අනුමැතිය ලැබී ඉටු වී නැත.
20	SLTB/TS/Civil/2015/16 IV	Repairing & Maintenance of Main Building in Driver Training School at Kalutara.	සිවිල් ඉංජිනේරු කොට්ඨාශය මගින් I අදියර නිමකර ඇත.
21	SLTB/TS/Gen/65 (i) 2015	Yutongබස්රථ සඳහා ටයර්ලබාගැනීමග	අවශ්‍යතාවය 254 ක් ඇණවුම් කළද මිලදී ගෙන ඇත්තේ 204 ක් පමණි.
22	SLTB/TS/Civil/2015/16-V	Quotation For Construction of waste water line at Angoda Depot.	සිදු කර නැත.
23	SLTB/TS/GEN/74/2015	Quotation For the Supply & Delivery of 50 Nos. Each Computers, UPS, Printers & 10 Nos. of Laptop Computers For SLTB	අවසන්.
24	SLTB/TS/Gen/10/2015/II	Quotation For the Supply & Delivery of Photocopy Machines For SLTB	අවසන්.
25	SLTB/TS/SUB/(Au)01/2015	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් පාවිච්චි කර භාවිතයෙන් ඉවත් කරන ලද අබලි බස්රථ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සුදුසු වෙන්දේසිකරුවෙකු තෝරා ගැනීම සඳහා මිළ ගනණන් කැඳවීම.	අවසන්.
26	SLTB/TS/GEN/2015/81	වේලා සටහන් පත් ඔරලෝසු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	අදාල ඩිපෝවන් වෙත මිලදී ගැනීම සඳහා අනුමත මිල ගණන් ලබාදී ඇත.
27	SLTB/TS/GEN/2015/02(ii)	මෝටර් රථ අමතර කොටස් (ටාටා සහ ලේලන්ඩ්) මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	අවසන්
28	SLTB/TS/Adv/2015	ශ්‍රී ලංගම බස්රථ 4000 ක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ප්‍රචාරන ආයතනයක් තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	ටෙන්ඩර් පත් විවෘත කිරීම පමණි.
29	SLTB/TS/Canteen/2015	ශ්‍රී ලංගම ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිලගණන් කැඳවීම.	අවසන්
30	SLTB/TS/GEN/2015/80	විදුලි අළුත්වැඩියා හා නඩත්තු කටයුතු වලදී අවශ්‍ය ආවුධ මිලදී ගැනීම.	අවසන්
31	SLTB/TS/GEN/07/2015	නව ඉන්ධන නිකුත් කිරීමේ පොම්ප 60 ක් මිලදී ගැනීම.	මිලදී ගෙන නොමැත.
32	SLTB/TS/Gen/Civil/10/2015/(VIII)	ශාලිකා ක්‍රීඩාංගනයේ ජේක්ෂකාගාරයේ අළුත්වැඩියා කටයුතු සඳහා තහඩු මිලදී ගැනීම.	අවසන්
33	SLTB/TS/GEN/2015/84	Quotation For the purchase of new wireless Access point to SLTB Head Office.	ඇණවුම් කළත් තවම සපයා නොමැත.
34	SLTB/TS/GEN/SpringBlades/01/2015	ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය දුනුකොළ මිලදී ගැනීම.	මිල කැඳවීම් පමණක් කළ අතර, මිලදී ගැනීම ප්‍රාදේශීය කාර්යාල

			මගින් සිදු කරයි.
35	SLTB/TS/GEN/55 /2015	එන්ජින් සම්පූර්ණ අලුත්වැඩියා සිදුකරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්මික තැනගේ අනුමැතිය මත මිළ අනුමත කරයි.
36	SLTB/TS/GEN/2015/84	Quotation for Electrical Items at SLTB Head Office.	ඉදිරි වැඩ කටයුතු සඳහා සම්පාදක අංශයට යොමුකර ඇත.
37	SLTB/TS/GEN/Civil/2015/16(IX)	Construction of Service pit at Siyambalanduwa Sub Depot.	නවතා ඇත.
38	SLTB/TS/GEN/Civil/2015/16(IX)	Construction of oil Interceptor (Brick Walls) Rubble Service Ramp at MaharagamaDipot.	සිදුකර නැත.
39	SLTB/TS/GEN/Civil/2015/16(IX)	Quotation for Proposed Time Keeper Building at Kandy bus stand near the clock Tower.	කාර්යය සිදු කර නොමැත.
40	SLTB/TS/GEN/2015/32	ගිනි නිවන උපකරණ වලට අවශ්‍ය කාබන්ඩයොක්සයිඩ් වායුව පිරවීම හා ඊට අදාල අලුත්වැඩියා සිදුකර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	සම්පූර්ණ කාර්යය නිම කර නොමැත.
41	SLTB/TS/GEN/79 /2015	ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය ටියුබ් සහ කරපටි සැපයීම හා ප්‍රවාහනයග	ඉදිරියට ගෙන යන ලදී.
42	SLTB/TS/GEN/2015/74/II	Quotation For The purchase of Computer Server Machine & UPS Machine For SLTB Head Office.	අවසන්.
43	SLTB/TS/GEN/Civil/2015/16(XI)	Construction of Steel Roof & Floor Concreting of Chogum bus Depot - Katubadda	සිවිල් ඉංජිනේරු අංශය මගින් සිදු කර ඇත.
44	SLTB/TS/GEN/2015/19/II	Quotation For Toner Item for SLTB Head Office	අවසන්
45	ශ්‍රීලංගම/ටෙ.ම/රියදුරු නි.ඇ/2015	2016 වර්ෂයට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ නිල වාහන රියදුරු කාර්ය මණ්ඩලයට නිල ඇඳුම් ලබාදීමට අවශ්‍ය රෙදි මිලදී ගැනීම හා මසා නිමකර ගැනිම සඳහා මිල ගණන් කැඳවීම.	අවසන්
46	SLTB/TS/GEN/05 /2015	ශ්‍රී ලංගම සියලුම ඩිපෝවන් සහ ප්‍රාදේශීය කාර්යාලීය මුදල් කොට්ඨාශ සඳහා මුදල් භාර ගැනීමේ කුවිතාන්සි (මු10) මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම.	අවසන්
47	SLTB/TS/Civil/16/2015	පිටකොටුව මධ්‍යම බස්රථ නැවතුම්පොළෙහි මෙට්‍රො ඉන් මගී ලැගුම්හල් සහ ආපන ශාලාව අලුත්වැඩියා කර අවුරුදු 05 ක කාලයක් සඳහා ශ්‍රී ලංගම වෙත මාසික බදු කුලියක් ගෙවා පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම.	බදු පදනමට ලබාදී ඇත.
48	SLTB/TS/GEN/28 /2015	ශ්‍රී ලංගම යූටෝන් බස්රථ සඳහා අවශ්‍ය නව බැටරි ලබා ගැනීම සඳහා මිල ගණන කැඳවීම.	ලබාගෙන නොමැත.
49	SLTB/TS/GEN/18 /2015	Quotation for the supply of Generator for SLTB	අනුමැතිය ලබාදී ඇත.
50	SLTB/TS/GEN/05 – (II)/2015	2016 වර්ෂය සඳහා ශ්‍රී ලංගම සියලුම ඩිපෝවන්ට අවශ්‍ය වාර්ෂික වාර ප්‍රවේශපත්‍ර මුද්‍රණය කරවා ගැනී සඳහා මිළ ගණන් කැඳවීමග	අවසන්
51	SLTB/TS/GEN/2015/65(II)	ශ්‍රී ලංගම යූටෝන් බස්රථ සඳහා අවශ්‍ය නව ටයර් 900 ක් සැපයීම හා ප්‍රවාහනය කිරීම සඳහා මිළ	ඉදිරියට ගෙන යන ලදී.

		ගණන් කැඳවීම.	
52	SLTB/TS/GEN/05 – (III)/2015	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය මුද්‍රිත පත්‍රිකා මුද්‍රණය කරවා ගැනීම - 2016	මිල අනුමත කර ඩිපෝ අවශ්‍යතාවය අනුව ලබාගැනීමට ඩිපෝ වලට දන්වා ඇත.
53	SLTB/TS/GEN/ADD/2015	ශ්‍රී ලංගම බස්රථ වල වෙළෙඳ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ප්‍රචාරන ආයතනයක් තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	අවසන්
54	SLTB/TS/GEN/90 /2015	ශ්‍රී ලංගමට අයත් බදුල්ල හිඳගොඩ තන්තිරිගේවත්ත ඉඩම් පරිශ්‍රය මාසික කුලී පදනම මත බදු දීම සඳහා ලංසු කැඳවීමග	තාවකාලිකව නවතා ඇත.
55	SLTB/TS/PS/01//2015	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය කාර්යාල, ප්‍රාදේශීය වැඩපලවල් සහ ඩිපෝවන් වෙත ආරක්ෂක සේවාවන් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.	සුදුසු සේවා අංශයන් අනුමත කර දී ඇත.
56	SLTB/TS/GEN/05 /2015	ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය මගී ටිකට් පොත් සහ ගමන් බඩු ප්‍රවේශපත්‍ර පොත් මුද්‍රණය කරවා ගැනීම සඳහා ලංසු කැඳවීම - 2016 වර්ෂය	මිල ගණන් අනුමත කර ඩිපෝ අවශ්‍යතාවයන් අනුව ලබා ගැනීමට ඩිපෝ දැනුවත් කර ඇත.
57	SLTB/TS/GEN/25 /2015	Bid for the obtaining of new Insurance Coverage For year – 2016	මිල කැඳවීම් පමණක් කළ අතර සේවාවන් ප්‍රාදේශීය කාර්යාල සහ ඩිපෝවන් මගින් සිදු කරයි.
58	SLTB/TS/GEN/25 /2015	ශ්‍රී ලංගම ප්‍රාදේශිය වැඩපොළ සඳහා අවශ්‍ය මිලදී ගැනීම් සඳහා කැඳවන ලද මිල ගණන් විවෘත කිරීම	අවසන්
59	SLTB/TS/GEN/2015/32 I	ශ්‍රී ලංගම යටිනුවර ප්‍රදේශීය වැඩපොළට අවශ්‍ය ගිනි නිවන උපකරණ මිලදී ගැනීම හා ගිනිනිවන උපකරණ අලුත්වැඩියා අංශය සඳහා නයිට්‍රජන් වායුව පුරවා ගැනීමට යන්ත්‍රයක් සාදා ගැනීම සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.	දැනට ලබාගෙන නොමැත
60	SLTB/TS/GEN/07 /2015	Quotation For the Purchase of Air Conditioners for SLTB	අවසන්
61	SLTB/TS/GEN/45 /2015	Quotation For the Supply of Electric Geezer for Circuit Bangalow (I) at NuwaraEliya SLTB	අවසන්
62	SLTB/TS/GEN/18 -I/2015	Quotation For the Supply of Generator for SLTB Hatton Depot.	මිලදී ගෙන නැත
63	ශ්‍රීලංගම/ටෙම/ටෝනර්(Scrap)/2014	ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ භාවිතයෙන් ඉවත කරන ලද ටෝනර් විකිණීම.	අවසන්
64	ශ්‍රීලංගම/ටෙම/පැරණි පුවත්පත්/2015/I	පැරණි පුවත්පත් මිල කැඳවීම.	අවසන්
65	SLTB/TS/SUI/01/ 2015	ශ්‍රී ලංගම ඌව, නැගෙනහිර ප්‍රාදේශිකයන්ට අයත් ඩිපෝවන් ස හ යටිනුවර ප්‍රාදේශීය වැඩපලේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි අමතර කොටස් විකිණීම.	අවසන්
66	SLTB/TS/SUB/01/ 2015	කොළඹ, රජරට, උතුර, ගම්පහ, කළුතර, වයඹ, ඌව, නුවරඑළිය, රුහුණු ප්‍රාදේශික වලට අයත් ඩිපෝවන් ලක්දිව ඉංජිනේරු සමාගම, මැදවච්චිය	අවසන්

		ප්‍රාදේශීය වැඩපොළ සහ කළුතර රියදුරු විදුහල යන ස්ථානයන්හි අබලි බස්රථ විකිණීමේ ටෙන්ඩරය.	
67	SLTB/TS/GEN/2015/93	ශ්‍රී ලංගම ටයර් කම්හලේ බහින් කුඩු විකිණීම සඳහා මිල ගණන් කැඳවීම.	අවසන්

තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ කොට්ඨාශය

1. පරිගණක 200 ක් මිලදී ගැනීම.

2. මුද්‍රණ යන්ත්‍ර 100 ක් මිලදී ගැනීම.

3. UPS යන්ත්‍ර 200 ක් මිලදී ගැනීම. ව්‍යාපෘතිය

4. Electronic Bus Ticket Machine 2200 මිලදී ගැනීම.

5. GPS යන්ත්‍ර සමඟ නාමපුවරු 2200 සවිකිරීම.

6. Salary System මෘදුකාංගය ක්‍රියාවට නැංවීම.

7. අදාල මෘදුකාංග සඳහා ලංගම සේවකයින් පුහුණු කිරීම.

8. දිනපතා ප්‍රධාන කාර්යාලයේ හා ශ්‍රී ලංගම ඩිපෝවන් හි ඇති වන පරිගණක හා ඒ ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම හා ඒවා නිසි ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කළමනාකරණය කිරීම.

වාණිජ හා සම්පාදක කොට්ඨාශය

1. දිවයින පුරා ඇති සියලුම ප්‍රාදේශීය වැඩපොළවල් වලට අවශ්‍ය අමතර කොටස් හා උපාංග මිලදී ගැනීම, පිළිවෙත් ප්‍රකාරව තොග ගත කිරීම, නිකුත් කිරීම, ලේඛනගත කිරීම සහ ඊට අදාල ගෙවීම් වවුචර් මූල්‍ය අංශය වෙත යොමු කිරීම. මීට අමතරව කාර්මික කොට්ඨාශයේ නිර්දේශය පරිදි දිවයින පුරා පිහිටි ඩිපෝ වලට අවශ්‍ය අමතර කොටස් මිලදී ගෙන ඉහත පරිදි නිකුත් කර ගෙවීම් කටයුතු සඳහා යොමු කිරීම.

2. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය සියලුම ලිපි ද්‍රව්‍ය ටෝනර් සහ පෙන් ඩ්‍රයිව්, සණක යන්ත්‍ර, වාර්ෂික අවශ්‍යතාව අනුව සියලුම කොට්ඨාශ හා අංශ වලින් ලැයිස්තු ලබාගෙන ඊට අදාල ටෙන්ඩර් මණ්ඩල වෙත ඉදිරිපත් කර ටෙන්ඩර් මිල කැඳවීම් කළ පසු එම මිල උප ලේඛනය කර ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කමිටු තීරණය මත මිල ගණන් හා සැපයුම්කරුවන් තෝරා අවශ්‍ය වාර්ෂික ලිපි ද්‍රව්‍ය ද්විමාසික අවශ්‍යතාවය මත ඇණවුම් කිරීම, බින්කාඩ් ගත කිරීම, ගෙවීම් හා පියවීම් කටයුතු කිරීම හා බෙදාහැරීම.

3. සියලුම කාර්යාල උපකරණ (පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග, මුද්‍රණ යන්ත්‍ර, UPS යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර, ඇඹිලි සලකුණු යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර) හා කාර්යාලීය ගෘහ භාණ්ඩ අවශ්‍යතාවය පරිදි ටෙන්ඩර් මණ්ඩල මිල අනුමැතියෙන් පසුව මිලදී ගැනීම, ගෙවීම් පියවීම් කටයුතු

කිරීම හා ටෙන්ඩර් මණ්ඩලය වෙත ලිඛිත ඉදිරිපත් කිරීම් කර ආවරණ ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාගැනීම.

4. අවශ්‍යතාවය පරිදි ශ්‍රී ලංගම ඩිපෝවන් ප්‍රාදේශීය වැඩපල හා ප්‍රාදේශිකයන් සඳහා අවශ්‍ය කාර්යාලීය උපකරණ හා කාර්යාලීය ගෘහ භාණ්ඩ උපකරණ මිලදී ගැනීමට අනුමත මිල හා සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු දැන්වීම.

5. ශ්‍රී ලංගම සියළුම සංචාරක බංගලාවන් හා නිවාඩු නිකේතන සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ, මුළුතැන්ගෙය උපකරණ, විදුලි උපකරණ, ටෙන්ඩර් අනුමත මිල අනුව මිලදී ගැනීම්, සැපයීම්, ගෙවීම් හා පියවීම් කටයුතු කිරීම හා ඉන්වෙන්ටරි ගත කිරීම.

6. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයට හා ප්‍රධාන කාර්යාලය යටතේ මූලා‍ ප්‍රතිපාදන ක්‍රියාත්මක වන සේවා ස්ථාන සඳහා අවශ්‍ය විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම, වායුසමීකරණ නඩත්තු, අලුත්වැඩියා සඳහා උපාංග, විදුලි උපාංග සහ අමුද්‍රව්‍ය ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය යටතේ මිලදී ගැනීම, සැපයීම, ගෙවීම, පියවීම් කටයුතු කිරීම.

7. ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය නව ටයර් කිට් සහ බැටරි මිලදීගෙන අවශ්‍යතාවයන් පරිදි ප්‍රාදේශීය කාර්යාල හරහා දිවයිනේ සියලුම ඩිපෝවලට බෙදා හැරීම සහ ඊට අදාල ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම, තොග පාලන කටයුතු කිරීම සහ ගෙවීම් කටයුතු සඳහා යොමු කිරීම.

8. වාර්ෂිකව ශ්‍රී ලංගම වෙත අවශ්‍ය වාර ප්‍රවේශපත්‍ර මුද්‍රණය කර තොග පවත්වාගෙන යෑම, අවශ්‍යතාවය පරිදි සියලුම ඩිපෝ වලට නිකුත් කිරීම, ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම සහ ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය වවුචර් පත්‍ර පිළියෙල කිරීම.

9. ශ්‍රී ලංගම සේවකයින් සහ බාහිර පුද්ගලයින් වෙත නිකුත් කරනු ලබන ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන නිකුත් කිරීම, ඊට අදාල ලේඛන පවත්වාගෙන යාම සහ ගෙවීම් කටයුතු සඳහා යොමු කිරීම.

10. යූටෝන්ග් බස්රථ සඳහා අවශ්‍ය අමතර කොටස් හා උපාංග චීනයේ සැපයුම්කරුවන් වෙතින් මිලදී ගෙන, ශ්‍රී ලංකා රේගුව වෙතින් අදාල භාණ්ඩ නිෂ්කාශනය කරවාගෙන අවශ්‍යතාවය පරිදි නිකුත් කිරීම, තොග ලේඛන පවත්වාගෙන යාම සහ ඊට අදාල ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය ලේඛන සැකසීම.

11. ශ්‍රී ලංගම යටතේ ඇති සංචාරක සහ නිවාඩු නිකේතන සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සහ භාණ්ඩ මිලදීගෙන සැපයීම සහ ඊට අදාල ලේඛන සහ ලිපිගොනු නඩත්තු කිරීම.

12. දිවයින පුරා ඇති රියදුරු අභ්‍යාස විද්‍යාල වලට අවශ්‍ය වාහන සහ අනෙකුත් භාණ්ඩ අවශ්‍යතාවයන් පරිදි මිලදී ගෙන ලබාදීම සහ ඊට අදාල ගබඩා ලේඛනයක් පවත්වාගෙන යාම.

13. වාහන මිලදී ගැනීම (නිල වාහන සඳහා) සඳහා වවුචර් පත් පිළියෙල කිරීම, ඊට අදාල ලේඛන සහ ලිපිගොනු නඩත්තු කිරීම.

14. කඩිනම් අවශ්‍යතා සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමත මිල ගණන් නොමැති අවස්ථාවලමිල කැඳවීම් කිරීම, උප ලේඛන සෑදීම, ආවරණ ටෙන්ඩර් අනුමැතිය ලබා ගැනීම.

15. ඉහත සියලුම මිලදී ගැනීම් කොටස් අංක යටතේ(W-Wise) වෙන්වෙන්ව විෂයන් ලෙස බෙදා වෙන්කර සේවක මණ්ඩලය වෙත පවරා රාජකාරි ඉටුකිරීම.

16. මිලදී ගන්නා සහ සැපයුම්කරන සියළුම විෂයන් බින් කාඩ් ගත කිරීමෙන් විධිමත් ලෙස තොග පාලන කටයුතු කිරීම.

17. ඇණවුම්, නිකුත් කිරීම් වවුචර් (S-1), ලැබීම් වවුචර් පිළියෙල කිරීම (S –5 – RV) සහ නිකුත් කිරීමේ වවුචර් (S-6 – IV) ලේඛන නියමිත පරිදි පරිගණක ගත කිරීමට කටයුතු කිරීම.

18. සියළුම මිලදී ගැනීම් වලට අදාල ලියාපදිංචි මිල කැඳවීම් මගින් ටෙන්ඩර් කැඳවා ඇති අවස්ථාවන් වලදී ඒවා විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර් විවෘත කිරීම, ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටු නිලධාරියෙකු ලෙස සහභාගි වීම, සියළුම මිල ගණන් උපලේඛනය කිරීම, මිල අනුමැතිය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

19. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සටහන් කර, විගණන හා කළමනාකරණ කමිටුව වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා යොමු කිරීම සහ ඉන්පසු වාර්ෂිකව අදාල ප්‍රගතිය පිළිබඳ වාර්තා පිළියෙල කිරීම.

20. ප්‍රධාන ගබඩාවේ දෛනික කටයුතු අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය උපදෙස් සහ ගබඩාකරණය, පිළිවෙත් හඳුන්වා දීම, ඒ අනුව කටයුතු කිරීම.

21. ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර සහ අනෙකුත් ලද උපකරණ අලුත්වැඩියා කළයුතු අවස්ථා වලදී අලුත්වැඩියාවන් සඳහා යොමු කිරීමට කටයුතු කිරීම සහ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම.

22. සියලුම ටෙන්ඩර් කටයුතු කළ පසු එම කටයුතු සඳහා උපලේඛන සැකසීම, ලිපි සැකසීම, ඇගයීම් කමිටු සඳහා ඉදිරිපත් කිරීම, ඇගයීම් වාර්තා සැකසීම.

23. අබලි බස්රථ, ටයර් පැරණි පුවත්පත් ටෙන්ඩර්, අනුමත මිල අනුව විකිණීම සහ අදාල මිල ගණන් ලැයිස්තුගත කිරීම සහ අදාල ලේඛන පිළියෙල කිරීම.

24. සියලුම මිලදී ගැනීම් වල බිල්පත් අවසාන ගිණුම් ගෙවීම් සඳහා යොමු කිරීම. ලේඛනගත කිරීම.

25. ශ්‍රී ලංගමට අයත් ප්‍රාදේශීය වැඩපලවල්, ඩිපෝ, ප්‍රාදේශීය කාර්යාල වල සම්පාදක නිලධාරී, සම්පාදක සහයක, ගබඩා පාලකවරුන් පිළිබඳ විස්තර පවත්වාගෙන යාම සහ පත් කිරීමට අදාල සම්මුඛ පරීක්ෂන වලට සහභාගි වීම සහ පත්කිරීමට සහ ස්ථාන මාරු වලට අදාල නිර්දේශ සහ අනෙකුත් සහ අධීක්ෂණ කටයුතු කිරීම.

පුහුණු පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය

අ.අ	වැඩසටහන	පුහුණුලාභීන්	පුහුණුලාභීන් ගණන	වියදම (රු)
01	E.R.P කොළඹ/ ගම්පහ/ කළුතර	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	143	42,645/-
02	වයඹ	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	59	ප්‍රාදේශික මගින්

03	රුහුණ	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	62	ප්‍රාදේශික මගින්
04	නුවර	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	57	ප්‍රාදේශික මගින්
05	බදුල්ල	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	36	ප්‍රාදේශික මගින්
06	සබරගමුව	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	42	ප්‍රාදේශික මගින්
07	රජරට	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	30	ප්‍රාදේශික මගින්
08	උතුර	ප්‍රා.පා කළමණාකාර/ප්‍රා. කළමණාකාර (ධාවන/මුදල්/ඉංජිනේරු)/ ඩිපෝ කළමණාකාර/සහකාර කළමණාකාර (මුදල්/ධාවන/ඉංජිනේරු)/පරිගණක ක්‍රියාකරු	40	ප්‍රාදේශික මගින්
09	ගබඩා පාලක	ගබඩා පාලක මහතුන් - කණ්ඩායම් I	80	32,685/-
		- කණ්ඩායම් II	80	35,555/-
10	නායකත්ව පුහුණුව සහ කළමණාකරණය	සියළුම ඩිපෝ කළමණාකාර	105	21,605/-
				20,409/-
				22,355/-
				20,090/-
				21,545/-
				18,110/-
				22,445/-
				19,557/-
				19,520/-
				21,820/-
				47,650/-
11	මාර්ග ආරක්ෂක පුහුණුව	බස්රථ රියදරු මහතුන්	90	17,635/-
			90	19,995/-
12	පරියේෂණ සංකල්ප	සහකාර කළමණාකාර (මුදල්)	43	19,197/-
		සහකාර කළමණාකාර (ඉංජිනේරු)	51	21,793/-
		සහකාර කළමණාකාර (ධාවන)	46	18,160/-
				462,771/-

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීටීපී/ඒ/එස්එල්ටීබී/එෆ්ඒ/01/2015/62 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජූනි 20 දින

සභාපති,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරනා මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම් විශාල ලෙස බාදනයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු. 28,977,203,239 ක සෘණ අගයක් වී තිබුණි. භාණ්ඩාගාරයේ හෝ රජයේ මූල්‍ය සහායක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇති විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය තත්ත්වය විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ජංගම වගකීම් ආවරණය කරගැනීම සඳහා ඇති ජංගම වත්කම් ප්‍රමාණය මුළු ජංගම වගකීම්වලින් සියයට 34 ක ට වඩා පහළ මට්ටමක පැවති අතර 2010 වර්ෂයේදී මෙම මට්ටම සියයට 42 ක් ලෙස පැවතුණි. ගෙවිය යුතු මුදල් නියමිත පරිදි නොගෙවීම, අය කරගත යුතු මුදල් අය කරගැනීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලීනව නිරවුල් නොවී පවතින ශේෂ මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හා අවසර දී ඇති විටක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් පහත සඳහන් හිලව් කිරීම් සිදුකර තිබුණි.

(i) ඉදිරිපත්කළ උපලේඛන අනුව බැංකු ගිණුම් 30 ක වාසිදායක මුදල් ශේෂ රු. 27,390,759 කින් අයිරා ශේෂ හිලව් කර තිබීම සහ බැංකු ගිණුම් 14 ක අයිරා ශේෂ රු. 20,691,606 ක් වාසිදායක ශේෂ සමග හිලව් කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල බැංකු මුදල් ශේෂය හා බැංකු අයිරාව පිළිවෙලින් රු. 45,853,652 ක් හා රු. 45,853,652 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල 3 ක එකතුව රු. 649,233,033 ක් වූ වෙළඳ ණයහිමි ශේෂයෙන් රු.32,700,544 ක ණයහිමි හර ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයහිමි ශේෂ ලෙස රු. 616,532,489 ක් දක්වා තිබුණි.

(iii) කළුතර වියදුරු පුහුණු පාසලේ රු. 12,657,758 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන් රු.46,080 ක බැර ශේෂයක් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iv) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු රු.66,516,172 ක් වූ ශේෂයෙන් රු.45,568,987 ක හර ශේෂයක් හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබූ රු. 120,428,954 ක තොග ගැලපීම් ගිණුමේ ශේෂය හා රු. 42,471,837 ක් වූ ඉන්ධන අතිරික්තතා හා ඌනතා ගිණුමේ ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් නොවන අයිතම යටතේ ගැලපීම් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කම ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළ යුතු නමුත් මණ්ඩලය සමාලෝචිත වර්ෂයේදී අත්පිට හා ලීසිං වශයෙන් මිලදීගෙන ප්‍රයෝජනයට ගෙන තිබූ වටිනාකම රු. 51,541,669 ක් දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වෙනම දැක්විය යුතු වුවද ඊට පටහැනි ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් සහ ගොඩනැගිලි ලෙස රු.319,799,319 ක් දක්වා තිබුණි. එම මුළු වටිනාකමෙන් සියයට 50 ක් එනම් රු.159,899,660 ක් ගොඩනැගිලි වටිනාකම ලෙස සලකා එම වටිනාකම මත සියයට 2.5 බැගින් වාර්ෂිකව ක්ෂය ගණනය කර තිබීම නිසා 2015 වර්ෂය වන විට ගොඩනැගිලිවල පිරිවැය ඉක්මවා රු. 1,048,812 ක් ක්ෂය කර තිබුණි.

(iii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 3,037,266,897 ක් වූ වත්කම් අයිතම 988 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි.

(iv) 2006 වර්ෂයේ සිට මිලදී ගෙන තිබූ වටිනාකම රු. 1,004,452,160 ක් වූ බස් රථ චැසීන් 825 ක් බස් රථවලට සවිකිරීමේදී අදාළ බස් රථයේ වටිනාකමට ප්‍රාග්ධනීත කර ආයුකාලය නැවත ඇස්තමේන්තු කළ යුතු වුවද ඊට පටහැනිව, මිලදී ගත් බස් රථ චැසීන් වෙනම ගිණුම්ගත කර 20% බැගින් ක්ෂය කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 31 (බී) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වගකීම දැක්වීමේදී එම කල්බදු වත්කම්වල සාධාරණ අගය හෝ ගෙවීමට ඇති කල්බදු වාරිකවල වර්තමාන අගය යන දෙකින් අඩු අගය දැක්විය යුතු අතර, එය පහත සඳහන් පරිදි හෙළිදරව් කළ යුතු විය. ඊට පටහැනි ලෙස මණ්ඩලය විසින් මූල්‍ය කල්බදු වගකීම පිරිවැය මතද, පොළී ප්‍රමාණය වාරික ගණනේ එකතු ක්‍රමය (Sum of digit method) මතද ගණනය කර රු. 10,032,569,943 ක් කල්බදු වගකීම යටතේ දැක්වීම පමණක් සිදුකර තිබුණි.

- කාලපරිච්ඡේදය අවසානයට අවම කල්බදු වාරිකය හා එහි වර්තමාන අගය සැසඳීම.
- වසරකට නොඅඩු කාලයකට, වසරකට වැඩි සහ වසර 05 කට අඩු සහ වසර 05 කට වැඩි කාලපරිච්ඡේදයන්ට අදාළව ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට වූ අනාගත කල්බදු වාරිකවල එකතුව හා ඒවායේ වර්තමාන අගයේ එකතුව.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන නිවැරදි ඇස්තමේන්තුවක් සිදුකළ යුතු වුවත් එලෙස කටයුතු නොකර එක් එක් ශ්‍රේණියේ මධ්‍යයන වැටුපට ජීවන වියදම් දීමනාව හා අතිරේක දීමනා එකතු කර නිලධාරීන් ගනනින් වැඩි කිරීම මගින් මුළු පාරිතෝෂික වෙන් කිරීම් ප්‍රමාණය ගණනය කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් අනුව ඩිපෝ 09 ක බැංකු ගිණුම් වෙත සෘජුව ලැබීම් හා බැංකු ගාස්තු පිළිවෙලින් රු.36,612,935 ක් හා රු. 2,629,593 ක් ආදායම් හා වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. අවස්ථා 07 කදී මුදල් සොතේ දෙවරක් හර කර තිබුණු රු. 1,973,578 ක් නිවැරදි කර නොතිබුණු අතර අවස්ථා 40 කදී සෘජු බැරවීම්, රු. 7,885,175 ක් දිගුකාලීනව නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අත්පිට හා ලිපිං ක්‍රමයට මිලදී ගනු ලැබූ රු. 1,751,869,409 ක් වටිනා බස් රථ වෙනුවෙන් රු.201,247,403 ක් ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ පාරිතෝෂික දීමනා වෙන්කිරීමේදී අන්තර් දීමනාව වැටුප් හා තවතනවලට එකතු කිරීම හේතුවෙන් රු. 357,740,000 ක් වැඩියෙන් පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර තිබුණි.

(ඈ) 2015 වර්ෂය සඳහා රු. 31,619,700 ක් වටිනා ඉලෙක්ට්‍රොනික් ටිකට් යන්ත්‍ර 900 ක් මිලදී ගෙන ඩිපෝ වෙත නිකුත් කර තිබුණ ද ඩිපෝ වත්කම් යටතේ එය රු.28,863,689 ක් ලෙස සටහන් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල වත්කම් ශේෂය හා ගෙවිය යුතු ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමේ ශේෂය රු. 2,756,002 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කතරගම විශ්‍රාම ශාලාව වැඩි දියුණු කිරීම 2015 ජූලි 16 දින නිමකර තිබුණද එහි ඉදිකිරීම් පිරිවැය වූ රු. 14,813,358 ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනීත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. එමනිසා එදින සිට දෙසැම්බර් 31 දක්වා එම ගොඩනැගිල්ලට අදාළ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) හොරොව්පතාන නව ඩිපෝවේ ඉදිකිරීම් කටයුතු නිමකර 2012 ජූනි 10 දින සිට මණ්ඩලයේ කටයුතු සඳහා භාවිතාකර තිබුණද, එහි ඉදිකිරීම් කටයුතු සඳහා දරන ලද රු. 32,436,772 ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනීත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ ලෙසින් දක්වා තිබුණි. ඒ හේතුවෙන් මෙම ගොඩනැගිලි සඳහා පසුගිය වර්ෂ 3 ½ කාලයකට අදාලව රු. 2,838,218 ක් වූ ක්ෂය ගණනයකර ගිණුම්ගත කිරීම මගහැරී තිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව මධ්‍යම බස්රථ කාර්යාලයේ එකතුව රු.9,000,000 ක් වූ ස්ථාවර තැන්පතු දෙක සඳහා ලැබුණු රු. 4,548,371 ක් වූ පොලිය නැවත ආයෝජනය කර තිබුණද එම වටිනාකමින් ආයෝජන ගිණුම හර කිරීම වෙනුවට ලැබිය යුතු ආදායම් ගිණුම හර කර තිබුණි.

(ඌ) 2015 ජූනි 01 දින සිට 2015 දෙසැම්බර් 31 කාල පරිච්ඡේදය සඳහා ස්ථාවර තැන්පතුවක් වෙනුවෙන් ලැබිය යුතු පොළිය රු. 162,503 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සිවිල් ආරක්ෂක බලකාය වෙත නිකුත් කළ බලපත්‍ර වෙනුවෙන් ලැබිය යුතු රු. 8,183,702 ක මුදල දෙවරක් වර්ෂයේ ආදායමට සහ ලැබිය යුතු ආදායම් ලෙස සටහන් කිරීම නිසා එම වටිනාකමින් වර්ෂයේ අලාභය අඩුවෙන් හා ලැබිය යුතු බලපත්‍ර ගාස්තු වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ඒ) මධ්‍යම බස්රථ කාර්යාලයේ 2015 වර්ෂය සඳහා අයවිය යුතු රු. 1,726,367 ක කඩකුලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසානයේදී ගර්භිත බස්රථ වටිනාකම රු. 1,592,669,139 ක් වූ අතර බස්රථයක සුන්බුන් අගය රු. 1000 ක් වශයෙන් හඳුනාගෙන තිබුණද එම සුන්බුන් අගය ද ඉක්මවා රු. 2,924,746 ක් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අනුව දේපළ පිරියත හා උපකරණ ක්ෂය වටිනාකම රු. 2,146,560,160 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ක්ෂය වටිනාකම රු. 2,147,944,061 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 1,383,901 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බස් රථ 427 ක් විකිණීමෙන් රු. 60,759,000 ක ආදායමක් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද කාර්මික අංශයේ තොරතුරු අනුව බස් රථ 584 ක් විකිණීමෙන් රු. 85,424,111 ක ආදායමක් ලැබී තිබූ බව

සටහන් කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම හා කාර්මික අංශයේ පොත්පත් අනුව රු. 24,665,111 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) කළුතර රියදුරු පාසලේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුල්ල ඩිපෝව වෙතින් රු. 3,091,346 ක් හා ඌව, සබරගමුව ප්‍රාදේශිකයන්ගෙන් සහ කතරගම ඩිපෝවෙන් එකතුව රු. 6,756,442 ක් ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි. එහෙත් බදුල්ල ඩිපෝවේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය ලෙස රු. 2,871,970 ක් පමණක් දක්වා තිබුණි.

(ඉ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයෙන් ප්‍රධාන කාර්යාලයට අයවිය යුතු මුදල් ලෙස රු. 1,033,171 ක් දක්වා තිබුණද උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ ගිණුම් අනුව ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතු මුදල රු. 570,834 ක් වුයෙන් වෙනස රු. 462,337 ක් විය.

2.2.5 අවිනිශ්චිත ගිණුම්

අවිනිශ්චිත ගිණුමේ හර හා බැර ශේෂ ගැලපීමෙන් පසු රු. 3,941, 993 ක් වූ බැර ශේෂය දීර්ඝ කාලයක සිට නිරවුල්කර නොතිබුණි.

2.2.6 විගණනාය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

ගිණුම් විෂයය	වටිනාකම (රු.)	ඉදිරිපත් නොවූ සාක්ෂි
(i) වෙළඳ ණයගිම්යෝ	228,781,504	විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ
(ii) වැඩපල ණයගිම්යෝ	64,187,315	
(iii) කැෂියර් හිඟ ශේෂය	1,271,364	
(iv) කොන්දොස්තර අත්තිකාරම්	15,249,736	
(v) විවිධ ණයගැතියෝ	99,647,683	
(vi) ලැබිය යුතු ආදායම්	253,051,561	
(vii) පාරිතෝෂික දීමනා	3,641,172,333	මුදල් ගෙවූ නිලධාරීන් පිළිබඳ තොරතුරු
(viii) වෙළඳ ණයගැති ශේෂය	3,193,451	උපලේඛන
(ix) ජංගම ගිණුම, ඉතිරි කිරීමේ ගිණුම් සහ ස්ථාවර තැන්පතු ගිණුම්	2,087,218,462	ගිණුම් 91 ක් සඳහා ශේෂ සනාථ ලිපි
(x) ඉඩම් හා ගොඩනැගිලි	319,799,318	වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛනය හා තක්සේරු වාර්තා
(xi) ජර්නල් සටහන් 06	5,016,723,610	ජර්නල් සටහන්වලට අදාළ විස්තර
(xii) තොග	744,821,576	විස්තරාත්මක තොග වාර්තා
(xiii) කාර්යසාධන බැඳුම්කර	1,312,727	විස්තරාත්මක ලිපි ලේඛන
(xiv) හොරොව්පතාන නව ඩිපෝව ඉදි කිරීම	4,548,536	ඇස්තමේන්තු මුදල ඉක්මවීමට අදාළ අනුමැතිය සහිත ලිපි
(xv) ගමන් බලපත්‍ර ආදායම් වට්ටම්	399,385,714	වට්ටම් අනුමත කිරීමේ ලිපි ලේඛන
(xvi) බැංකුවට බැර නොකළ ශේෂයන්	2,843,042	බැර ශේෂයන් හි වයස් විශ්ලේෂණය
(xvii) මුදල් පොතට වැඩිපුර හර කළ ශේෂයන්	457,460	කාලය සනාථ කරන ලිපි, විස්තරාත්මක උප ලේඛන
(xviii) බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි දක්වා ඇති හර නොවූ චෙක්පත්	7,090,334	ශේෂ සනාථ ලිපි විස්තරාත්මක උප ලේඛන
(xix) ක්‍රියාකාරී නොවූ ගිණුම් - හර	9,935,375,095	කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි
(xx) ක්‍රියාකාරී නොවූ ගිණුම් - බැර	26,054,948,782	කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුල ත්‍රස්ත විපත්වලින් මියගිය සේවකයන්ට ගෙවූ වැටුප් ලෙස ගිරිඋල්ල ඩිපෝවට රු.1,569,519 ක් හා අලව්ව ඩිපෝවට රු. 2,174,792 ක් භාණ්ඩාගාරයෙන් අය විය යුතුව පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආරක්ෂක නිලධාරීන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පුද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට සේවයේ යොදවා තිබූ අතර එම ආරක්ෂක නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු. 40,604,269 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. 2013 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 වන විට තවදුරටත් රු. 36,922,769 ක් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිකයන් 5 කට අදාලව බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු වසර 10 කට වඩා පැරණි එකතුව රු. 12,070,995 ක් වූ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බදුල්ල ඩිපෝවෙහි 2011 වර්ෂයේ සිට පැවත එන හිඟ කැෂියර් ශේෂය රු. 33,662,732 ක් හා මොණරාගල හා බදුල්ල ඩිපෝවෙහි ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු. 9,260,302 ක් හා රු. 8,455,334 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය තෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි නොපියවූ ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණය අනුව රු. 1, 778,661,537 ක් හෙවත් සියයට 93 ක් වසර 01 කට පෙරද සියයට 38 ක් හෙවත් රු. 721,380,174 ක් වසර 2 ට පෙරද ලබා දුන් අත්තිකාරම් වන අතර ඒවා නිරවුල් කර නොතිබුණි.

(ඊ) බැංකු ගිණුමකට අදාළව ලැබිය යුතු ආදායම්වලින් රු.193,375,188 ක් හිඟව පැවති අතර එම මුදලින් අර්ථසාධක අරමුදල් ණය ගිණුමට අදාළව ලැබිය යුතු මුදල මුළු මුදලින් සියයට 81 ක් වන අතර ඒ සඳහා වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු යුධ හමුදා ගමන් බලපත්‍ර හා විශේෂ කුලී ආදායම් පිළිවෙලින් රු.41,784,537 ක් හා රු.188,616,652 ක් අයකර ගෙන නොතිබුණි.

(ඥ) 2008 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු ආදායම් යටතේ බණ්ඩාරවෙල ඩිපෝවෙහි ශේෂය රු. 1,108,756 ක සිට රු. 12,537,456 ක් දක්වා වැඩිවෙමින් පැවති අතර ඒ අනුව අය නොවීමේ ප්‍රතිශතය සියයට 43 සිට සියයට 90 දක්වා වූ පරාසයක පැවතුණි.

(ට) මධ්‍යම බස්රථ කාර්යාලය විසින් බදු දී ඇති කඩකාමර වෙනුවෙන් 2015 වර්ෂයට අදාළ බිල්කළ විදුලිය හා ජල බිල්පත් ගාස්තු පිළිවෙලින් රු. 2,314,383 ක් හා රු. 1,197,133 ක් වූ අතර, අදාළ කාලය තුළ මුදලින් ලද වටිනාකම් පිළිවෙලින් රු. 1,816,471 ක් හා රු. 866,601 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු ශේෂයන් හා ආදායම් රු.828,443 ක් ගිණුම්ගත වී නොතිබුණි.

(ඨ) මධ්‍යම බස්රථ කාර්යාලයේ හිඟ කඩකුලී ආදායම් ලෙස රු. 1,863,414 ක මුදලක් 2009 වර්ෂයේ සිට පැවත එන අතර එම මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

	නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතුවල රු. 19,733,819 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ආ)	1981 අංක 26 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වගන්තිය	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවලට අයත් රු.1,662,003,377 ක දායක මුදල් සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5 (1) වගන්තිය හා 1992 අංක 62 දරණ (සංශෝධිත) පනත	සේවය අවසන් කර දින 30 ක් ඇතුළතදී පාරිතෝෂික දීමනා ගෙවීම් සිදුකළ යුතු වුවද 2015 හා ඊට පෙර වර්ෂවලදී විශ්‍රාම ගිය ඩිපෝ 5ක සේවකයන් 172 නකු වෙත ගෙවිය යුතු රු. 67,244,193 ක පාරිතෝෂික දීමනා 2015 දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 19 දක්වා පරාසයක ප්‍රමාදයක් සිදු වී තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 177 (1)	ලැබෙන මුදල් දිනපතා හෝ හැකිතාක් ඉක්මනින් ප්‍රේෂණය කළයුතු වුවත්, බදුල්ල ඩිපෝවෙහි 2012 වර්ෂයේ සිට 2015 දක්වා වූ රු. 34,249,522 ක මුදලක් අඩුවෙන් බැංකුගත කර තිබුණු අතර ඩිපෝව විසින් අඩුවෙන් තැන්පත් කිරීම හඳුනාගෙන අවශ්‍ය කටයුතුකර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 177 (3)	වලපනේ හා තෙල්දෙණිය ඩිපෝ විසින් 2014 හා 2015 වර්ෂවලදී එකතු කර තිබූ රු. 1,214,386 ක ආදායමක් 2015 දෙසැම්බර් 31 දක්වාම බැංකුගතකර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 395 (ආ)	සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය මගින් පවත්වාගෙන යන ජංගම බැංකු ගිණුම් 156 න් ජංගම ගිණුම් 59කට අදාළ බැංකු සැසඳුම් වාර්තා විගණනය කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iv)	මුදල් රෙගුලාසි 395 (ඉ)	නියැදි පරීක්ෂණයට අනුව බැංකු ගිණුම් 7ක එකතුව රු. 20,838,069 ක් සඳහා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් හා බැංකු ගිණුමක එකතුව රු.129,845 ක තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ උපලේඛන බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ඉදිරිපත් කර නොතිබුණි.
(v)	මුදල් රෙගුලාසි 396 (ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළව විගණනයට ඉදිරිපත් වූ බැංකු ගිණුම් 95න් බැංකු ගිණුම් 15 ක සැසඳුම් ප්‍රකාශනවල මාස 06 ඉක්ම වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 58 ක එකතුව රු.1,880,020 ක් විය. මෙම චෙක්පත් වර්ෂ 04ක පමණ දීර්ඝ කාලයක සිට පැවතුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(vi)	මුදල් රෙගුලාසි 395 (උ)	නිලධාරීන්ට රාජකාරී පැවරීමේදී මුදල් පොත පිළියෙල කිරීමට සම්බන්ධ නොවූ පුද්ගලයෙකුට බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ කාර්යය පැවරිය යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.
(vii)	මුදල් රෙගුලාසි සංග්‍රහය 757	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය අවසානයට රු. 11,633,840,656 ක් වටිනා දේපළ පිරියත හා උපකරණ මණ්ඩලය සතු වුවද එම සියලු වත්කම් ඇතුළත් වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.751,260,743 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,228,021,529 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 476,760,786 කින් අඩු වී තිබුණි. මණ්ඩලයේ මෙහෙයුම් වියදම් රු. 4,566,344,326 කින් සහ පරිපාලන වියදම් රු. 1,612,418,157 කින් වැඩි වී තිබුණ ද මගී ප්‍රවාහන ආදායම් සහ අනෙකුත් ආදායම් රු. 7,045,280,367 කින් වැඩිවීම ඉහත පිරිහීම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මණ්ඩලයේ ඌනතාවය ක්‍රමයෙන් වැඩි වී තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඌනතාවය ක්‍රමයෙන් අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වර්ධනය වී තිබු අතර 2012 වර්ෂයේ දී රු. 11,499,778,412 ක් වූ දායකත්වය 2015 වර්ෂයේ දී රු. 21,644,512,472 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන පනතට අනුව මණ්ඩලයේ අරමුණු පහත දැක්වේ.

- ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය විමසා ආර්ථික ස්ථාවරත්වය ඇතිකරමින් කාර්යක්ෂම සහ ඵලදායී විධිමත් බස් සේවාවක් සැපයීම.
- ඉහත සඳහන් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයේ යෝජනා ඇතුළත් කරමින් සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු ආකාරය හඳුනා ගනිමින් සහ විවිධ යෝජනා සඳහා වගකිව යුතු අදාළ පරදු තබන්නන් හඳුනා ගනිමින් සහ සම්පූර්ණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ගතවීමට ඉඩ ඇති කාල සීමාව සඳහන් කරමින් මණ්ඩලය විසින් වාර්ෂික සැලැස්මක් පිළියෙල කළ යුතුය.එම වාර්ෂික සැලැස්මට අදාළ වාර්ෂික අයවැයක්ද පිළියෙල කළ යුතුය.
- මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රබලත්වය උපරිමයක් වන බවට සහතික වීම සඳහා එම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යායුතු ආකාරයට මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම.
- පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වන ආකාරයට ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනත් යෝජනා ක්‍රම හෝ සේවා ක්‍රියාත්මක කිරීම.

2015 වර්ෂයේ මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මට අනුව සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව සහ අයවැය ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව මණ්ඩලයේ බලතල අනුව ක්‍රියාත්මක කළ හැකි පහත දැක්වෙන කාර්යයන් සංයුක්ත සැලැස්ම සැකසීමේ දී අවධානය යොමු වී නොතිබුණි.

- මණ්ඩලය විසින් ප්‍රවාහනය කරනු ලබන මගීන් සඳහා බස් නැවතුම්පලවල් හෝ ආවරණ සැපයීම.
- ප්‍රායෝගික නොවන හෝ දුෂ්කර බවට මණ්ඩලය විසින් සලකනු ලබන මාර්ගවල බස් සේවා සැපයීම.
- මණ්ඩලයට අයත් බස් රථ නැවතුම් ස්ථාන සපයාදීම සහ නඩත්තු කිරීම.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ ලඟා කරගැනීමට බලාපොරොත්තු වූ ඉලක්ක සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෛනිකව ධාවනය කරනු ලබන බස්රථ ප්‍රමාණය 6000 ක් දක්වා ඉහළ නැංවීමට ඉලක්කකර තිබුණද සැලසුම් අංශයේ වාර්තා අනුව දෛනිකව ධාවනය කර තිබුණේ බස්රථ 5270 ක් පමණි. මේ අනුව සියයට 12 ක ඉලක්කයක් ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) 2015 වර්ෂයේදී ධාවනය කිරීමට අපේක්ෂිත කිලෝමීටර් ප්‍රමාණය 643,184,516 ක් වුවත් ධාවනය කර තිබුනේ කිලෝමීටර් 440,424,544 ක් පමණි. ඒ අනුව ඉලක්කගත කිලෝමීටර් ප්‍රමාණයෙන් 202,759,972 ක් හෙවත් සියයට 31.5 ක් ධාවනය කිරීමට නොහැකි වී තිබුණි.

(iii) දෛනික මාර්ග ලේඛන ආදායම රු. මිලියන 80 ක් දක්වා ඉහළ නැංවීමට සැලසුම්කර තිබුණ ද, රු. මිලියන 66 ක ආදායමක් පමණක් ලබාගෙන තිබුණි. මේ අනුව ඉල්ලකගත ප්‍රමාණයෙන් සියයට 17.5 ක දෛනික ආදායමක් ලබාගෙන නොතිබුණි.

(ඇ) පූර්ණ වශයෙන් අළුත්වැඩියා කළ යුතු බස්රථ හා දෛනිකව ඇතිවන සුළු අළුත්වැඩියා හේතුවෙන් ධාවනයෙන් ඉවත්වන බස්රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීමට අරමුණු කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනට පැවති මුළු බස්රථ ඇණිය 7,797 ක් වුවද පහත දැක්වෙන හේතු මත එම බස්රථ ඇණියෙන් බස්රථ 1,511 ක් හෙවත් සියයට 20 ක් පමණ ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවතුණි.

විස්තරය	ධාවනය නොවන බස්රථ සංඛ්‍යාව
ටයර්, ටියුබ් සහ බැටරි නොමැතිව නතර වූ බස්රථ	169
කට්ටල්, උපකට්ටල් නොමැතිව නතර වූ බස්රථ	400
තඩාග සිදුවෙමින් පවතින බස්රථ	90
හදිසි අනතුරු අළුත්වැඩියාවේ පවතින බස්රථ	77
ධාවනය වීමේ දී ඇතිවන සුළු කාර්මික දෝෂ නිසා අළුත්වැඩියාවේ පවතින බස්රථ	261
කට්ටල් අළුත්වැඩියාවේ පවතින බස්රථ	226
විශාල අළුත්වැඩියා සඳහා නතර වී ඇති බස්රථ	260
අළුත්වැඩියාවෙන් ආර්ථික වාසි නොවන බස්රථ	28
මුළු එකතුව	**1511**

බස්රථ වලින් 569 ක් ටයර්, ටියුබ් හා කට්ටල් නොමැතිවීම හේතුවෙන් ධාවනයට යොදවා නොතිබුණි. එමෙන්ම එම බස්රථ ඇණියෙන් 778 ක් අවුරුදු 15කට වඩා පැරණි බස්රථ විය.

(ඇ) බස්රථ පුනරුත්ථාපනය කර රථ ඇණියට එක් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයට රු. මිලියන 880 ක් මණ්ඩලයෙන් වෙන්කර තිබුණු අතර 2015 වර්ෂය තුළ දී රු. මිලියන 1037.12 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් එම මුළු මුදල වූ රු. මිලියන 1,917.12 ක් වියදම් කර තිබුණ ද මණ්ඩලයේ සැලසුම් අංශයේ වාර්තා අනුව පුනරුත්ථාපනය සඳහා ඉලක්කගත ප්‍රමාණයෙන් බස්රථ 861 ක් හෙවත් සියයට 48 ක් පුනරුත්ථාපනය කරගත නොහැකි වී තිබුණි. අපේක්ෂිත ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

	2015 වර්ෂය		
විස්තරය	ඉලක්කය	සත්‍ය තත්ත්වය	ලඟාකර ගැනීමට නොහැකි වූ ප්‍රමාණය
එන්ජින් කට්ටල්	720	500	220
ගියර් පෙට්ටි	720	173	547
බස් බෝඩ	360	266	94
එකතුව	**1800**	**939**	**861**

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු අක්කර 127 ක ඉඩම් වෙනත් ආයතන හා පුද්ගලයන් විසින් භුක්ති විඳිනු ලබන අතර එම ඉඩම් ආපසු ලබා ගැනීමට, නීත්‍යානුකූලව පැවරීමට හෝ විකිණීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉඩම් අක්කර 18 ක් මණ්ඩලය විසින් දීර්ඝ කාලීනව බදු පදනම යටතේ භාවිතා කරමින් පැවතියද ඒ සඳහා ඉඩම් ආඥා පනතට අනුව ලබා ගතයුතු නිදහස් දීමනා පත්‍ර ලබාගැනීමට විගණිත දින වූ 2017 සැප්තැම්බර් 15 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 1966 ජූලි 26 සිට බදු පදනම යටතේ ලබාගෙන තිබුණු කොළඹ 05, උද්‍යාන පාරේ පිහිටි හෙක්ටයාර් 3.4125 ක්වූ ඇන්ඩර්සන් ගොල්ෆ් ලින්ක්ස් පිටිය, ශාලිකා ශාලාව හා ක්‍රීඩා පිටිය අයත් ඉඩම හා ගොඩනැගිල්ල රු. 300,000 ක වටිනාකමට මූල්‍ය ප්‍රකාශනයේ ඉඩම් ගොඩනැගිලි යටතේ දක්වා තිබුණද, එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලය විසින් ලබාගෙන නොතිබුණි. 2009 පෙබරවාරි 18 අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මෙම ඉඩම් සඳහා නිදහස් දීමනා පත්‍රයක් ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත භාර දී ඇතත් විගණිත දිනය වූ 2017 සැප්තැම්බර් 15 වන විටත් නිදහස් දීමනා පත්‍රයක් ලබාගෙන නොතිබුණි

(ඈ) 2004 සැප්තැම්බර් 15 දිනැති අංක අමප 04/1196/023/015-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සතු මහරගම දෙහිවල පාරේ පිහිටි 9167 දරන මූලික පිඹුරේ දැක්වෙන තහනම් කැලේ වත්ත පර්. 160.02 ක ඉඩම (හෙක්ටයාර් 0.4055) 2004 නොවැම්බර් 09 දින මණ්ඩලය විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණි. මෙම ඉඩම 2016 පෙබරවාරි මාසයේදී රු. 112,000,000 කට රජයේ තක්සේරු විසින් තක්සේරු කර තිබුණු අතර 2017 සැප්තැම්බර් 15 විගණිත දින වන විටද මෙම මුදල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනත යටතේ අත්කර ගෙන තිබූ අංක 175, ගාලු පාර රත්මලානේ පිහිටි පර්චස් 26.5 ක ඉඩම රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටු වීම සඳහා දිසාපති වෙත ලබා දී ඇතත් එම ඉඩම තක්සේරු කර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවලට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමේදී ප්‍රධාන කාර්යාලයෙන් සැපයුම්කරුවන් තෝරාගෙන ගෙවීම් සිදු කර තිබුණ ද සැපයුම්කරුවන් විසින් සෘජුව ඩිපෝ වෙත අමතර කොටස් සපයා තිබුණි. නමුත් ඩිපෝ විසින් අදාළ ඉන්වොයිස්පත් හා භාණ්ඩ ලද බවට සහතික ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි 2014 දෙසැම්බර් 31 දිනට රු. 1,831,859,235 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂය 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,907,294,471 දක්වා වර්ධනය වී තිබුණි. භාණ්ඩ ලැබුණු පසු මුදල් ගෙවීම කළයුතු වුවත් ඊට පටහැනි ලෙස අමතර කොටස් මිලදී ගැනීමේදී කටයුතු කර තිබීම අත්තිකාරම් ශේෂය වර්ධනය වීම කෙරෙහි හේතු වී තිබුණි.

(උ) මධ්‍යම බස්රට කාර්යාලයේ කඩ කාමර 58 කින් 9 ක් සඳහා පමණක් 2015 දෙසැම්බර් 31 දින වන විට බදු ගිවිසුම් වලංගුව පවතින අතර ඉතිරි ගිවිසුම් 49 හි බදු කුලී ගිවිසුම් යල් පැනගිය ඒවා විය. ඒවායින් සමහර ගිවිසුම් 1970 වර්ෂයේ සිට පැවත එන බවත් එම බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම සඳහා අදාළ අංශ පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) මධ්‍යම බස්රට කාර්යාලය විසින් බදු දී ඇති කඩකාමර සඳහා උප ජල මීටර හා උප විදුලි මීටර සවිකර ජලය හා විදුලිය ලබා දෙමින් 2015 වර්ෂය සඳහා බිල්කර අයකරගත් මුදල පිළිවෙලින් රු. 1,197,133 ක් හා රු. 2,314,394 ක් වුවත් මධ්‍යම බස්රථ කාර්යාලය විසින් ජලය හා විදුලිය වෙනුවෙන් රු. 7,130,972 ක් හා රු. 7,975,010 ක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යම බස්රථ කාර්යාලය විසින් ජලය හා විදුලිය වෙනුවෙන් රු. 5,933,839 ක් හා රු. 5,660,616 ක් අමතර වියදම් දරා තිබුණි. මෙහිදී පරිභෝජනය කරන විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වැඩි වනවිට ගාස්තුව වැඩිවීම නිසා මධ්‍යම බස්රථ කාර්යාලය විසින් වැඩි මුදලක් ගෙවිය යුතු වන අතර කඩකුලී හිමියන්ගෙන් විදුලිය හා ජල බිල්පත් අයකර ගැනීමේදී එය නොසළකා අඩු රේට්යක් අයකර ගැනීම, මෙම තත්ත්වයට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක සුභසාධනය සඳහා සේවක දඩ අරමුදල් ගිණුමෙන් සේවකයන් වෙත ලබා දී තිබූ ණයවලට අදාලව අයකර තිබූ රු. 84,733,235 ක ණය වාරික අදාල අරමුදලට බැර කිරීමකින් තොරව රඳවාගෙන තිබුණි.

(ආ) මණ්ඩලීය අර්ථසාධක අරමුදලින් සේවකයින් වෙත ලබාදුන් ණය සඳහා සේවක වැටුපෙන් අඩුකරගෙන තිබුණු වාරික මුදල් රු.249,486,944 ක් අදාළ අරමුදල වෙත ලබා නොදී මණ්ඩලය තුළ රඳවාගෙන තිබුණි. මණ්ඩලීය අර්ථසාධක අරමුදල වර්තමානය වන විට අහෝසි කර ඇති බැවින් මෙම මුදල් නිරවුල් කරන ආකාරය පිළිබඳ තොරතුරු විගණනයේ දී ගැටළු සහගත වී තිබුණි.

(ඇ) කතරගම විශ්‍රාම ශාලාවේ අදියර 02 හි ඉදිකිරීම් සඳහා රු. 7,912,368 ක් ගෙවා තිබියදී 2013 ජූනි 20 දින කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණි. එම නිසා මණ්ඩලයට සිදුවූ පාඩුව අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව රු. 658,351 ක කාර්යසාධන බැඳුම්කරය කල්පිරීමට පෙර මුදල් කර නොගැනීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගෙන් එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව වාහන සේවා කටයුතු සිදු කරන සියළුම ඩිපෝ විසින් ඊට අදාළව බලපත්‍රයක් ලබා ගත යුතු වුවද ඊට අදාළ ඉදිරිපත් වූ තොරතුරු අනුව ප්‍රාදේශික 6 න් ඩිපෝවන් 7 ක් පමණක් මෙම බලපත්‍රය ලබා ගෙන ඇති බවත් ඩිපෝවන් 35 ක් බලපත්‍ර ලබා ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

4.4 දෘශ්‍ය අක්‍රමිකතා

2012 සිට 2015 වර්ෂය දක්වා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සතු ඩිපෝ සඳහා නැප්කෝ නාමය යටතේ නිෂ්පාදිත දුනුකොළ සැපයීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත මුදල් ගෙවීමේදී මුදල් රෙගුලාසි 137 හා 138 පරිදි දුනු කොළ ලැබුනු බව තහවුරු කර නොගෙන නැප්කෝ සමාගම විසින් අයවිය යුතු මුදල් ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම පදනම් කර ගෙන මණ්ඩලය විසින් රු. 127,150,000 ක් ගෙවීම්කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින දක්වාම සැපයුම්කරු අදාළ දුනුකොළ සපයා නොතිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) වාරියපොල හා මහව ඩිපෝවන්හි ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් බණිජතෙල් නීතිගත සංස්ථාව වෙත නියමිත පරිදි ගෙවීම නොකිරීම නිසා 2015 වර්ෂයේදී රු. 2,718,706 ක මුදලක් අධිභාර ලෙස ගෙවීම්කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට පිළිවෙලින් බැර කළ යුතු රු. 5,291,223,198 ක් හා රු.52,065,963 ක් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් රු.124,276,193 ක් හා සේවක භාරකාර අරමුදල වෙනුවෙන් රු. 11,458,689 ක් අධිභාර වශයෙන් ගෙවීමට සිදුව් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට බැර කළ යුතු රු. 45,491,197 ක දායකය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර රු. 12,728,496 ක අධිභාර මුදලක් සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව මණ්ඩලය විසින් ගෙවීමට ඇති බවට නිරීක්‍ෂණය විය.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය ප්‍රකාරව මණ්ඩලය සතු සම්පත් බාහිර ආයතන වෙත මුදා නොහැරිය යුතු වුවත් මණ්ඩලයේ ආරක්‍ෂක අංශයේ නිලධාරීන් හා වාහන ප්‍රවාහන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. මෙහිදී ප්‍රවාහන අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති ආරක්‍ෂක අංශයේ සේවකයින් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් 2015 වර්ෂය සඳහා මණ්ඩලය විසින් රු. 4,723,789 ක් ද මාසික කුලී පදනමට ලබාගත් මෝටර් වාහන 03ක් ප්‍රවාහන අමාත්‍යාංශයට හා නියෝජ්‍ය ප්‍රවාහන අමාත්‍ය කාර්යාලයන් වෙත මුදා හැර එහි ඉන්ධන වියදම් මණ්ඩලය දරා තිබුණු අතර මෝටර් වාහන 3 ක් සඳහා කුලිය වශයෙන් රු. 356,852 ක් හා රියදුරු වැටුප් හා අතිකාල රු. 393,392 ක්ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

4.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී පිරිවැය රු. 97,462,160 ක්වූ බස්රථ 143 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙස්කෝ ආයතනයට යවා තිබුණි. එහෙත් වෙස්කෝ ආයතනය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයක නොපවතින බැවින් අදාළ බස්රථ නැවත මණ්ඩලයට ගෙන්වා ගැනීම පිළිබඳ අවධානමක් පැවතියද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ඒ පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ තොරතුරු අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට සේවක දායක මුදල් වශයෙන් රු. 3,695,712,194 ක් සේවක වැටුපෙන් අයකර ඇතත් එම මුදල් නියමිත පරිදි මණ්ඩලය විසින් පවත්වාගනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම නිසා අදාළ කාලයට ලැබිය යුතු පොළී ප්‍රමාණය සේවකයන්ට අහිමි වී තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වෙනි පරිච්ඡේදයට අනුකූලව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්, බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ඩිපෝවල රියදුරු තනතුරුවල සියයට 28 ක අතිරික්තයක සිට සියයට 35 ක ඌනතාවයක් දක්වා වූ පරාසයක විහිදී තිබුණු අතර කොන්දොස්තර තනතුරුවල සියයට 51 ක අතිරික්තයක සිට සියයට 36 ක ඌනතාවයක් දක්වා විහිදී පැවතුණි. කෙසේ වුවද කොන්දොස්තර හා රියදුරු තනතුරු අතිරික්තව ඇති ඩිපෝ 25ක් වූ අතර එම අතිරික්ත කාර්ය මණ්ඩලය රියදුරු හා කොන්දොස්තර ඌනතාවය ඇති ඩිපෝවලට අනුයුක්ත කර රියදුරු කොන්දොස්තර හිඟය පියවා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. එමෙන්ම 2015 මැයි 01 දිනට කාර්යය මණ්ඩලය පිළිබඳව විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව රියදුරු සේවකයින් 235 ක් හා කොන්දොස්තර සේවකයින් 528 ක් අනුචිත කාර්යයන්හි යොදවා තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ වර්ෂ 01 මාස 05 ක් ප්‍රමාද වී එනම් 2017 ජූලි 19 දිනයේදිය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව ලඟා කරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුළත් කර පිළියෙල කර තිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, 4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම එසේ සකස් කර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2015 වර්ෂයට පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ තොරතුරු හා 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු සැසඳීමට හැකිවන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් අයවැයගත ආදායම් හා වියදම් සහ සත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පවතින්නේ ද යන්න හා එය ආයතනයේ

මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බවට නිරීක්ෂණය විය.

(ආ) විගණනයේ දී සැසඳීම් කළ හැකි වූ වියදම් පරීක්ෂා කිරීමේදී මණ්ඩලයේ වියදම් අයිතමයන් 19 ක අයවැයගත වටිනාකම් සහ තථ්‍ය වටිනාකම් අතර සියයට 4 ක සිට සියයට 99 ක් දක්වා විචලනයන් පැවතුණි.

(ඇ) මණ්ඩලයේ අයවැයගත මුළු ආදායම රු. 44,417,885,626 ක් වූ අතර තථ්‍ය මුළු ආදායම රු. 39,828,386,904 ක් වූයෙන් රු.4,589,498,722 ක හෙවත් සියයට 10.34 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

5.5 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වගන්තියට අනුව දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය පිටමං කිරීමත්, තැන්පත් කිරීමත් හෝ මෝචනය කිරීමෙන් කෙරෙන සෑම කටයුත්තක් සඳහාම ඉහත වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු වේ. එම ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලබන සෑම මෝටර් වාහනයක්ම වායු විමෝචන පරීක්ෂාවට ලක් කර අනුකූලතා සහතිකයක් ලබා ගත යුතු වන අතර නියෝග අංක 09 ට අනුව මෝටර් වාහනය යන්නට බස්රථ ද ඇතුළත් වන බව සඳහන් වී ඇති බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහාද වායු විමෝචන සහතික ලබාගත යුතු වුවත් ප්‍රාදේශීය කාර්යාල 10 ක තොරතුරු අනුව 2015 වර්ෂයේ මුළු බස්රථ 6729 කින් බස්රථ 550 ක් පමණක් වායු විමෝචන සහතික ලබා ගෙන තිබුණි. ඒ අනුව මුළු බස්රථ සංඛ්‍යාවෙන් සියයට 92 ක් දුම් සහතික ලබා නොගෙන ධාවනය කිරීම නිසා රාජ්‍ය ආයතනයන් මගින් විශාල පාරිසරික හානියක් හා පාරිසරික නීති රෙගුලාසි වලට අනුකූල නොවීමක් සිදු කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ) ස්ථාවර වත්කම් පාලනය	(i)	මණ්ඩලයේ බස් රථවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම.
	(ii)	වත්කම් මිලට ගැනීම හා ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල වීම.
	(iii)	වාර්ෂිකව වත්කම් සත්‍යාපනය සිදු නොකිරීම.
(ආ) මූල්‍ය පාලනය	(i)	ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම.
	(ii)	නිවැරදි ලෙස බැංකු සැසඳුම් පිළියෙල නොකිරීම.
	(iii)	අත්තිකාරම් ලේඛන පවත්වා නොගැනීම.
	(iv)	සේවක ඇප තැන්පත් සඳහා ලේඛන පවත්වා නොගැනීම හා සේවක ඇප තැන්පත් මුදල් මණ්ඩලයේ වියදම් සඳහා යොදා ගැනීම.
	(v)	මුදල් අංශය විසින් අවශ්‍යතාවයකින් තොරව ජංගම බැංකු ගිණුම් පවත්වාගෙන යාම, මාසික සැසඳුම් නොකිරීම හා ගැලපීම් නොකිරීම.
(ඇ) අත්තිකාරම් පියවීම	(i)	ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු නොකිරීම.
	(ii)	කාලීන සැසඳීම් හා පියවීම් නොකිරීම.

(ඇ) ආදායම් පාලනය		ගමන් බලපත්‍ර ආදායම් එකතු කිරීම් සඳහා අනුක්‍රමික අංක සහිත මුද්‍රිත ඉන්වොයිස් පත්‍ර භාවිතා නොකිරීම.
(ඉ) ගබඩා පාලනය	(i)	ප්‍රධාන කාර්යාලයෙන් ඇණවුම්කර සැපයුම්කරුවන් විසින් ඩිපෝ වෙත සෘජුව ලබා දී තිබූ භාණ්ඩ පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට වාර්තා නොකිරීම හා සැසඳීම් සිදු නොකිරීම.
	(ii)	පරීක්ෂාවකින් තොරව භාණ්ඩ භාර ගැනීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති